www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලය

# ජෙෆ්රි ස්වේන් හා ඉයන් ඩී. තැචර් විසින් රචිත ට්‍රොට්ස්කි ජීවන චරිත ද්වය පිලිබඳ ව විවරනයක්

**දෙවන කොටසඃ සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ බිඳ වැටීමෙන් අනතුරුව ට්‍රොට්ස්කි පිලිබඳ අධ්‍යයනයක්**

**Leon Trotsky and the post-Soviet school of historical falsification**
**A review of two Trotsky biographies by Geoffrey Swain and Ian Thatcher - Part 2**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2007 මැයි 10**

*මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සභාපති වූ ද සමාජවාදී සමානතා පක්ෂයේ (ඇමරිකා එක්සත් ජනපද) ජාතික ලේකම් වූ ද ඩේවිඩ් නෝර්ත් විසින් මහාචාර්ය ජෙෆ්රි ස්වේන් සහ මහාචාර්ය ඉයන් ඩී. තැචර් යන ශාස්ත්‍රාලිකයින් දෙදෙනා ලියූ ලියොන් ට්‍රොට්ස්කිගේ චරිතාපදාන දෙකක් ගැන කරන ලද කොටස් හතරකින් යුත් විවරනයක දෙවන කොටසයි.*

*ට්‍රොට්ස්කි, ජෙෆ්රි ස්වේන් විසිනි. පිටු 248, ලෝන්ග්මන්, 2006.*

*ට්‍රොට්ස්කි, ඉයන් ඩී. තැචර් විසිනි. පිටු 288, රූට්ලෙජ්, 2003.*

1991 දෙසැම්බරයෙහි සෝවියට් සංගමයෙහි ගරා වැටීම ලියොන් ට්‍රොට්ස්කිගේ ඓතිහාසික කාර්යභාරය පිලිබඳ ප්‍රශ්නය හදිසි අවශ්‍යතාවකින් ඉස්මතු කලේ ය. අවසාන වශයෙන් පවසතොත් සෝවියට් සංගමයේ ගරා වැටීම පැහැදිලි කිරීමක් ඉල්ලා සිටියේ ය. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය බිඳ විසුරුවා හැරීම වට කොට ගෙන පැන නැගුනු ධනේශ්වර ජයග්‍රහන උන්මාදය මධ්‍යයෙහි - මෙය එක ද ප්‍රධාන ධනේශ්වර දේශපාලන නායකයකු වත් පෙර දැක තිබුනේ නැත - පිලිතුර පැහැදිලි සේ පෙනී ගියේ ය. 1991 දෙසැම්බරයෙහි සෝවියට් බිඳ වැටීම 1917 ඔක්තෝබර් විප්ලවයෙන් ඓන්ද්‍රීය ලෙස ගලා ආවේ ය. මෙම න්‍යාය පාදක කෙරී තිබුනේ, ධනේශ්වර රූපාකාරය නොමැති මානව සමාජයක් පැවතිය නො හැකි ය යන පිලිගැනීම මත ය. සෝවියට් ගරා වැටීමට අනතුරුව ප්‍රකාශයට පත් කෙරුනු පොත් කිහිපයක් තුලට ද මෙම මතය රිංගා ගත්තේ ය. ඒ පිලිබඳ ව වඩාත් ම වැදගත් නිදර්ශනය වූයේ මහාචාර්ය මාටින් මාලියාගේ ද සෝවියට් ට්‍රැජඩි නමැති කෘතියයි.

කෙසේ වෙතත් මෙම වර්ගයේ කෘති ඓතිහාසික විකල්ප පිලිබඳ ගැටලුව මග හැරියේ ය. එනම් ස්ටැලින් හා ඔහුගේ අනුප්‍රාප්තිකයන් විසින් අනුගමනය කරනු ලැබුනු පිලිවෙත්, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය හමුවෙහි පැවති එක ම විකල්පය වී ද යන්න යි. සෝවියට් සංගමය එහි ඉතිහාසයේ විවිධ ස්ථානවල දී වෙනත් පිලිවෙත් අනුගමනය කලේ නම් එමගින් මීට සැලකිය යුතු පරිමානයකින් වෙනස් ඓතිහාසික ප්‍රතිඵල ජනනය වීමට පුලුවන්කමක් නො තිබුනේ ද? මෙම ප්‍රශ්නය හැකි තරම් සාරාංශ ගත කොට ඉදිරිපත් කරමුඃ ස්ටැලින්වාදයට විකල්පයක් තිබුනේ ද? මා මෙය ඉදිරිපත් කරනුයේ හුදෙක් වියුක්ත පරිකල්පනාත්මක ප්‍රතිපක්ෂයක් හැටියට නො වේ. ස්ටැලින්වාදයට සමාජවාදී විපක්ෂයක් පැවතියේ ද? මෙම විපක්ෂය පිලිවෙත හා ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් බැරෑරුම් හා සැලකිය යුතු විකල්පයක් යෝජනා කලේ ද?

එබඳු තීරනාත්මක ප්‍රශ්නවලට පිලිතුරු දෙනු පිනිස ලියොන් ට්‍රොට්ස්කිගේත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය (සෝසසසං) තුල හා ජාත්‍යන්තර වශයෙන් ඔහු නායකත්වය දුන් විරුද්ධ පාර්ශ්වීය ව්‍යාපාරයේත් අදහස් කෙරෙහි බැරෑරුම් ලෙස යලි ආසක්ත වීමක් අවශ්‍ය වන්නේ ය. එහෙත් මෙය සිද්ධ වූයේ නැත. මුල් කාලීන ශාස්ත්‍රඥයන් පරම්පරාවන්හි ජයග්‍රහන මත ගොඩනගනවා වෙනුවට, පසුගිය වසර 15ක කාලය තුල අත්පත් කර ගත හැකි ව තිබෙන පෘථුල හා නව පුරා විද්‍යාත්මක මූලාශ්‍ර උපයෝග කර ගන්නවා වෙනුවට සෝවියට් සංගමයේ ඓතිහාසික විද්‍යාවෙහි අධිපති ප්‍රවනතාව යොමු වී ඇත්තේ බෙහෙවින් ම වෙනස් දිශාවකට ය.

සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයෙහි බිඳ වැටීමෙන් අනතුරුව ගත වූ වසර කිහිපය,

ඓතිහාසික විකෘති කරනයේ පශ්චාත් සෝවියට් ගුරු කුලය යනුවෙන් විස්තර කල හැකි යමක ඉස්මතු වීම දුටුවේ ය. මෙම ගුරු කුලයෙහි ප්‍රධාන අරමුන වී ඇත්තේ සැලකිය යුතු දේශපාලනික පෞරුෂයක් හැටියට ලියොන් ට්‍රොට්ස්කි නිග්‍රහයට පත් කිරීමත් ඔහු ස්ටැලින්වාදයට විකල්පයක් ඉදිරිපත් කල බව එසේ නො වේ නම් ඔහුගේ දේශපාලනික උරුමය වර්තමානයට අදාල වන, අනාගතයට වටිනා කිසියම් දෙයක් ගැබ් කර ගත්තේ ය යන්න ප්‍රතික්ෂේප කිරීමත් ය. සෑම ඉතිහාසඥයෙකුට ම ඔහුගේ හෝ ඇගේ දෘෂ්ටි කෝනයට අයිතියක් ඇත්තේ ය. එහෙත් මෙම දෘෂ්ටිකෝන කරුනු එක් රැස් කිරීම හා ඓතිහාසික සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බැරෑරුම්, අවංක හා මූලධර්මාත්මක ආකල්පයක් මත පදනම් කල යුත්තේ ය. එසේ වෙතත් ලියොන් ට්‍රොට්ස්කි පිලිබඳ ව නව ජීවන චරිත ද්වයෙහි - එකක් ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයෙහි මහාචාර්ය ජෙෆ්රි ස්වේන් විසින් ද අනෙක බටහිර ලන්ඩනයේ බෲනල් විශ්වවිද්‍යාලයෙහි මහාචාර්ය ඉයන් ඩී. තැචර් විසින් ද ලිඛිත - නින්දනීය ලෙස නොමැති වනුයේ ද මෙකී අත්‍යවශ්‍ය ගුනය යි. මෙම කෘති ප්‍රකාශයට පත් කෙරී ඇත්තේ විශාල හා බලපෑම් සහගත ප්‍රකාශන ආයතන විසිනි. ස්වේන් විසින් ලිඛිත ජීවන චරිතය ප්‍රකාශයට පත් කෙරී ඇත්තේ ලෝන්ග්මන් විසිනි. තැචර්ගේ කෘතිය රූට්ලෙජ් විසිනි. ලියොන් ට්‍රොට්ස්කි පිලබඳ ව ඔවුන්ගේ රචනා අල්ප වූ ද ශාස්ත්‍රීය ගුනයකින් තොර ය. කෘති ද්වය ම ට්‍රොට්ස්කිගේ ලේඛන ප්‍රයෝජනයට ගන්නේ සීමිත ආකාරයකට ය. ඔවුන් සැලකිය යුතු උපුටා දැක්වීම් කරනුයේ අල්ප වශයෙනි. ඔව්හු ප්‍රධාන පෙලේ කෘති, රචනා සහ දේශපාලන ප්‍රකාශන නො තකා හරිත්. ජීවන චරිත සැලකිය යුතු නව ගවේෂන පාදක කර ගෙන ඇති බවට ප්‍රකාශකයන්ගේ ප්‍රකාශන ඇතත් ස්වේන් වත් තැචර් වත් හාවඩ් හා ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලවල තැන්පත් කෙරී තිබෙන ට්‍රොට්ස්කිගේ ලේඛනවල ප්‍රධාන පෙලේ පුරා විද්‍යාත්මක එකතු කිරීම් උපයෝග කර ගත් බවට ඇඟවීමක් ඇත්තේ නැත. ට්‍රොට්ස්කිගේ ජීවිතය පිලිබඳ ව මැනවින් තහවුරු කෙරී තිබෙන තොරතුරු, 'ප්‍රශ්නයට බඳුන් කෙරී' හෝ කර්තෘන්ගේ ම සුපුරුදු වැකි මගින් පවසතොත් 'මිථ්‍යාවන්' හැටියට නො තකා හැරී ඇත. ස්වේන් හා තැචර් ට්‍රොට්ස්කි පිරිහෙලමින් ඔහුට සරදම් පවා කරන අතර ස්ටැලින්ට විශ්වසනීයත්වයක් හා නීත්‍යානුකූල භාවයක් අත්පත් කර දීමට යලියලිත් උත්සාහ දරත්. ඔව්හු බොහෝ විට ට්‍රොට්ස්කිගේ විවේචනවලින් ස්ටැලින් ආරක්ෂා කරත්. තව ද ඔව්හු ට්‍රොට්ස්කිට හා වාම විරුද්ධ පක්ෂයට එරෙහි ව එල්ල කෙරුනු ප්‍රහාර යුක්ති යුක්ත කිරීමට හේතු කාරනා සම්පාදනය කරති. බොහෝ අවස්ථාවල ට්‍රොට්ස්කි පිලිබඳ ඔවුන්ගේ ම විවේචන ද පැරනි ස්ටැලින්වාදී විකෘත කරනයන්හි ප්‍රතිචක්‍රී කෘත ප්‍රකාශන වෙයි.

ස්වේන්ගේ හා තැචර්ගේ ජීවන චරිත ද්වයෙහි සන්දර්භයන්, සැලැස්මෙන් ද පිටුවක දීර්ඝත්වයෙන් ද එක හා සමාන ය. පැහැදිලි ව ම ඒවා යොමු කෙරී ඇත්තේ ශිෂ්‍ය පාඨක පිරිසකට ය. තම පාඨකයන් බොහෝ දෙනෙකු හට ට්‍රොට්ස්කි පලමුවරට හමු වනුයේ මෙම පොත්වලින් බව කර්තෘවරු දනිත්. ඔවුන් මෙම කෘති ද්වය සකස් කොට ඇත්තේ පාඨකයන් තුල තම විෂය ගැන වැඩි දුර උන්නඳුවක් ඇති නො වන ආකාරයට ගනන් බලමිනි. මහාචාර්ය ස්වේන් ඔහුගේ වෙලුමෙහි පලමු වන ඡේදයෙහි පැහැදිලි ව ම තෘප්තියකින් ප්‍රකාශ කොට තිබෙන පරිදි 'මෙම ජීවන චරිතය කියවන්නන් ට්‍රොට්ස්කිවාදයට මං පෙත් පාදා ගනු නැත'.[21] ඔහුට මෙසේ ද පැවසිය හැකි ව තිබුනිඃ ඔවුන් ට්‍රොට්ස්කිගේ අදහස්, ඔහු රැක ගැනුමට සටන් කල මූල ධර්ම, විසි වන සිය වසෙහි ට්‍රොට්ස්කිට හිමි තැන පිලිබඳ ව අවබෝධයක් ලබා ගන්නේ ද නැත.

## ට්‍රොට්ස්කි පිලිබඳ " මිථ්‍යාව"

ජීවන චරිත ද්වය ම ප්‍රකාශ කර සිටිනුයේ ඒවා ට්‍රොට්ස්කිගේ ජීවිතය හා වැඩ කටයුතු පිලිබඳ 'මිථ්‍යාවන්' අභියෝගයට පාත්‍ර කරන බව ඒවා පිරිහෙලන බව හා ඒවා අනුමත නොකරන බවත් ය. තැචර් විසින් ලිඛිත ජීවන චරිතයට කෙටි පෙර වදනක් ලියන ප්‍රකාශකයා පවසා සිටිනුයේ විශේෂයෙන් ම රුසියාවෙහි 1905 ප්‍රථම විප්ලවයේ හා රුසියානු සිවිල් යුද්ධයේ විප්ලවවාදියෙකු හැටියට "ට්‍රොට්ස්කිගේ වික්‍රමාන්විත වැඩ කටයුතු පිලිබඳ මූලික මිථ්‍යාවන් ප්‍රශ්නයට බඳුන් කෙරෙන බව ය."[22] ස්වේන් අවධාරනය කරනුයේ තමන්ගේ කෘතියෙන් 'ට්‍රොට්ස්කි පිලිබඳ ව සාම්ප්‍රදායික ව අඳිනු ලැබෙන චිත්‍රයට බෙහෙවින් වෙනස් චිත්‍රයක් උද්ගත වන බව ය; වැඩියෙන් මිනිසා පිලිබඳ ව, මිථ්‍යාව පිලිබඳ ව අඩුවෙන්.'[23] ඔවුන් නැති කර දැමුමට යත්න දරනුයේ කවර 'මිථ්‍යාවන් ද ?' ලේඛකයන් දෙදෙනා ම අයිසැක් ඩොයිෂ්චර්ගේ කෘති හෙලාදැකීම සැලකිල්ලට බඳුන් විය යුතු ය. අද දක්වා ම බල පවත්වන වීර වික්‍රමාන්විත ඓතිහාසික පුද්ගල චරිතය නිර්මානය කිරීම පිලිබඳ ව වගකීම ඔවුන් දෙදෙනා විසින් ම අයිසැක් ඩොයිෂ්චර්ට පැවරේ. තැචර් අහංකාර පරවශ ව පවසනුයේ ඩොයිෂ්චර්ගේ ත්‍රිත්වය 'පිරිමි ළමයකුගේ වික්‍රමයන් පිලිබඳ කථාවක් සේ කියවෙන බව ය.' එමගින් 'ඩොයිෂ්චර්ගේ යුගයෙහි ආකර්ශනයන් ගැන සේ ම දුර්වලත්වයන් පිලිබඳ ව ද ඇඟවීමක් කෙරේ.' ඩොයිෂ්චර්ගේ ජීවන චරිතය වීරාභිවාදනයක් පිලිබඳ සැක කටයුතු ප්‍රයත්නයක ප්‍රතිඵලයක් යැයි තැචර් ඇඟවුම් කරයි. තව ද ඩොයිෂ්චර්ගේ කෘතිය 'ට්‍රොට්ස්කි තමන් වටා සිටියවුන්ට වඩා දුර දිග දුටු ගැඹුරින් දුටු අවස්ථාවන්ගෙන් ගහන ය.' පැහැදිලි ව ප්‍රකට වන උපහාසයෙන් යුතු ව තැචර් ඇඟවුම් කරනුයේ

ඩොයිෂ්චර් ට්‍රොට්ස්කිට දේශපාලනික ප්‍රායෝගික හා බුද්ධිමය ජයග්‍රහන පිලිබඳ ව ඇදහිය නො හැකි තරම් දිග ලැයිස්තුවක් පවරා දෙන බව ය. නුසුදුසු 'මවා පෑම්වලට' හා 'ප්‍රබන්ධ කරනයන්ට යොමු වීම' පිලිබඳ ව තැචර් ඩොයිෂ්චර්ට චෝදනා කරයි. ඔහු මෙසේ ද පවසයි: 'මෙම වැරදි' 'ඉතිහාස කෘතියක් හැටියට ග්‍රන්ථයේ අගය පිරිහෙලයි. එහෙයින් ඉතිහාසඥයන් හැටියට අප එය කරා එලඹිය යුත්තේ විචාරාත්මක ව හා ප්‍රවේසම් සහගත ව ය.'[24]

සත්තකින් ම සියලුම ඉතිහාස කෘති, එම ගනයේ අග්‍ර කෘති පවා කියවිය යුත්තේ විවේචනාත්මක ව ය. එහෙත් තැචර් ඩොයිෂ්චර්ගේ කෘති හෙලා දකිනුයේ එහි පවත්නා දුර්වලතා මුල් කර ගෙන නො ව එහි ඉමහත් ම ශක්තිය මුල් කර ගෙන ය; එනම්, එම කෘතිය ට්‍රොට්ස්කිගේ පුද්ගල චරිතය පුනස්ථාපනය කරන සුවිශිෂ්ට විලාශයට ය. මවා පෑම හා ප්‍රබන්ධ කරනයට යොමු වීම පිලිබඳ ව තමන්ගේ චෝදනාව සනාථ කරනු පිනිස තැචර් උපයෝග කර ගන්නා විශේෂිත නිදර්ශනය 'ද ප්‍රොෆට් ආම්ඩ්' කෘතියෙන් උපුටා ගැනුනු අසම්පූර්න උද්ධෘතයකි. එම උද්ධෘතය සම්පූර්න වශයෙන් ම කියවූ කල්හි ඩොයිෂ්චර් විසින් ආන්තික අර්බුදයක් බල පැවැත්වූ සමයක බොල්ෂෙවික් නායකත්වය තුල පැවති මනෝගතිය - 1918 පෙබරවාරි මාසයෙහි බ්‍රෙස්ට් ලිටොව්ස්ක් ගිවිසුම සම්බන්ධිත ගැටුම - ප්‍රතිනිර්මානය කිරීමට යොදා ගැනෙන සාදෘෂ්‍යය කර්තෘවරයාගේ අපූරු සාහිත්‍යමය කුශලතා හා මනෝවිද්‍යාත්මක අන්තර්-දෘෂ්ටිය පිලිබඳ නිදර්ශනයක් හැටියට අගය කල හැකි ය.2[25]

. ඩොයිෂ්චර්ගේ ත්‍රිත්වය කෙරෙහි කර්තෘන් දෙදෙනාගේ විරෝධයෙහි අදාලත්වය, ස්වේන් විසින් ලිඛිත ජීවන චරිතයෙන් මැනවින් ඉස්මතු වෙයි. ඔහු චෝදනාත්මක ව ලියනුයේ "ඩොයිෂ්චර් ට්‍රොට්ස්කි මිථ්‍යාව අනුව ගිය බවත් සත්තකින් ම එය වගා කිරීමට උපකාර කල බවත් ය. එනම්, ට්‍රොට්ස්කි 'හොඳ ම බොල්ෂෙවික්වාදියා වූ බවය.' ලෙනින් හා ට්‍රොට්ස්කි සහයෝගී ව ඔක්තෝබර් විප්ලවය ජයග්‍රහනය කලහ. විප්ලවය එහි නිලධාරිවාදීමය පරිහානියෙන් මුදා ගැනුමට 1922 අවසානයෙහි සිට ම, ට්‍රොට්ස්කි ලෙනින්ගේ සහයෝගය ඇති ව අනවරතයෙන් ස්ටැලින්ට අභියෝග කලේ ය; සිදුවීම් පිලිබඳ මෙම වාර්තාවට අනුව ට්‍රොට්ස්කි ලෙනින්ගේ උරුමක්කාරයා ය."[26]

"මිථ්‍යාවක්" යනු වෙබ්ස්ටර්ගේ නිර්වචනයට අනුව "පදනම් විරහිත හෝ ව්‍යාජ සංකල්පයකි." එහෙත්, ඩොයිෂ්චර් විසින් වගා කෙරුනු ට්‍රොට්ස්කි මිථ්‍යාවෙහි අංග හැටියට ස්වේන් විසින් ලැයිස්තු ගත කෙරී තිබෙන සියලුම දේවල් ලේඛන ගත සාක්ෂි මගින් පිටුබලය ලබන කරුනු මත පාදක කෙරුනේ වෙයි. එම ලේඛන ගත සාක්ෂ්‍ය පසුගිය අර්ධ ශත වර්ෂය මුලුල්ලේ ඉතිහාසඥයන් ගනනාවක් විසින් උපුටා දක්වනු ලැබී ඇත. ඩොයිෂ්චර් ඓතිහාසික සත්‍යයට එරෙහි ව කුමන්ත්‍රනයක ගැලී සිටියේ ය යි (ඩොයිෂ්චර් මිථ්‍යාව අනුව ගිය අතර සත්තකින්ම එය වගාකිරීමට ආධාර කලේ ය) ස්වේන් විසින් ඇඟවුම් කෙරේ. එසේ වෙතත් ඔහුගේ සැබෑ අරමුන වනුයේ දශක ගනනාවක ස්ටැලින්වාදී විකෘති කරනයන් පුපුරවා හල - ඩොයිෂ්චර්ගේ හා තවත් බොහෝ දෙනෙකුගේ - ඓතිහාසික කර්තව්‍යයන් අවමානයට පාත්‍ර කිරීම යි. ට්‍රොට්ස්කිගේ ජීවිතය පිලිබඳ ව මැනවින් තහවුරු කෙරී තිබෙන ඓතිහාසික කරුනු වධ බෙර සහිත යුද්ධාධිකරනයක් බඳු සාහිත්‍යමය අධිකරනයක් හමුවට පමුනුවා හුදු "මිථ්‍යාවන්" යැයි ප්‍රකාශයට පත් කරනු ලැබේ. බැරෑරුම් පරීක්ෂනයක් දරා සිටීමෙහි සමත් කරුනු මත පාදක කෙරුනු කිසි ම සාක්ෂ්‍යයක් ස්වේන් හා තැචර් විසින් ප්‍රකාශයට පත් කෙරෙන තීන්දුවට පිටුබලය සපයනු වස් ඉදිරිපත් නො කෙරේ. ව්‍යාජ ජීවන චරිතයක් රචනා කිරීමෙහි ලා ඔවුන්ගේ අභ්‍යාසයෙහි අරමුන ට්‍රොට්ස්කිගේ ඓතිහාසික ස්ථානය ඩොයිෂ්චර්ගේ කෘති හා ඊ.එච්. කාර්ගේ ද කෘති ප්‍රකාශයට පත් වීමට පූර්වයෙන් පැවති තත්වයට යලි පත් කිරීම යි. - එනම්, විකෘති කරනයේ ස්ටැලින් ගුරු කුලයෙහි අන්ධකාර ම කාල පරිච්ඡේදයෙහි පැවති තත්වයට පෙරලා පත් කිරීම යි.

## අධිකාරීත්වයට කෙරෙන ආයාචනය

දැන් අපි, මැනවින් තහවුරු කෙරී ඇති ඓතිහාසික කරුනු අවමානයට පත් කරනු පිනිස මහාචාර්යවරුන් දෙදෙනා විසින් උපයෝග කර ගැනෙන විධික්‍රමය පිරික්සා බලමු. ස්වේන් සහ තැචර් යන දෙදෙනාට බෙහෙවින් ප්‍රිය මනාප තාක්ෂනයන්ගෙන් එකක් නම් කරුනු අතින් සත්‍යය යැයි සම්මත යමක මුහුනට ම කඩා පතින විධියේ සාහසික හා ප්‍රකෝපකාරී කියමනක් ට්‍රොට්ස්කි සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කිරීම යි; අනතුරුව තවත් ලේඛකයකුගේ කෘතියකින් කෙරෙන උපුටා දැක්වීමකින් තම අදහසට පිටුබලය සැපයීම යි. ස්වේන් සහ තැචර්ගේ අදහසට පිටුබලය සපයන අලුත් කරුනු පාඨකයා හමුවට පත් නො කෙරේ. ඒ වෙනුවට කරනු ලැබෙනුයේ තම ප්‍රකාශනය වෙනයම් ඉතිහාසඥයකුගේ කෘතියක් මත පාදක කෙරී ඇති බව සරල ව ප්‍රකාශ කිරීම ය.

ඒ අනුව, ස්වේන් ප්‍රකාශ කරනුයේ තමන් " වෙනත් ශාස්ත්‍රඥයන්ගේ කෘති මත බෙහෙවින් යැපී ඇති බව ය. ඉයන් තැචර් විසින් 1917ට පූර්වයෙන් සිටි ට්‍රොට්ස්කි යලි සොයා ගැනී ඇත. එසේ ම ට්‍රොට්ස්කිගේ ම ලියවිලි කෙතරම් නම් අවිශ්වසනීය ද යන්නත් ඔහු විසින් පැහැදිලිව පෙන්නුම් කෙරේ. ජේම්ස් වයිට්, 1917 ලෙනින් සහ ට්‍රොට්ස්කි අතර පැවති සම්බන්ධය මුලුමනින් ම යලි විමසා බලයි. සන්නද්ධ නැගිටීම පිලිබඳ ව ලෙනින් හා ට්‍රොට්ස්කි දරූ අදහස් සහමුලින්ම

එකිනෙකට වෙනස් බැව් ඔහු පෙන්වා දෙයි. ට්‍රොට්ස්කි ලෙනින්ගේ උරුමක්කාරයා ය යන අදහස එරික් වැන් රී විසින් විනාශ කර දැමේ. රිචඩ් ඩේ මීට වසර 30කට වැඩි කලෙකට පෙර ලියමින් ඒත්තු ගැන්වෙන පරිද්දෙන් තර්ක කලේ ට්‍රොට්ස්කි ජාත්‍යන්තරවාදියෙකු වීමට බෙහෙවින් දුරස්ථ ව තනි රටේ සමාජවාදය ගොඩනැගීමේ හැකියාව දැඩි ලෙස විශවාස කල බව ය. ඊට වඩා විවාදයට පාත්‍ර වන පරිද්දෙන් නිකොලායි වැලැන්ටිනෝව් මීට වසර 50කට පමන පෙර ඇඟවූම් කලේ 1925 දී ට්‍රොට්ස්කි, ස්ටාලින්ට විරුද්ධ වනවා වෙනුවට ඔහු හා සන්ධාන ගත ව සිටි බව ය; රහසි ගත රැස්වීමක දී තහවුරු කර ගන්නා ලද ගිවිසුමක් පිලිබඳ වැලැන්ටිනෝව්ගේ ඇඟවීමට කාලයේ අභියෝගය දරා සිටිය නො හැකි වුවත් ගැටුම් සහගත සහයෝගිතාවක කාල පරිච්ඡේදයක් වෙනත් සාක්ෂ්‍ය මගින් සනාථ කෙරේ".[27]

මෙහි දී ඉදිරිපත් කෙරී ඇත්තේ තර්ක ශාස්ත්‍රයෙහි අධිකාරිත්වයට කෙරෙන ආයාචනයක් යනුවෙන් හැඳින්වෙන දෙය යි. කෙසේ වෙතත් මෙබඳු ආයාචනයක් අදාල වනුයේ අධිකාරිත්වයේ විශ්වසනීයත්වයේ පරිමානයට යි. එහෙත් මෙම විශේෂ අවස්ථාවෙහි හුදෙක් තැචර්, වයිට්, වැන් රී, ඩේ හා වැලන්ටිනෝව් උපුටා දැක්වීමෙන් පමනක් තර්කනය නො සැපිරේ අප ඔවුන් ගැන, ඔවුන්ගේ වැඩ ගැන, ඔවුන් තම නිගමන පාදක කරන සාක්ෂ්‍ය ගැන වැඩි දුරටත් දැන ගත යුතු ය. එසේ ම අප, ඔවුන්ට පවරා දෙනු ලැබෙන ආස්ථානය ඔවුන් සැබැවින් ම දරා සිටියේ ද යන්නත් දත යුතු ය. අපට දැක ගත හැකි වන ආකාරයට අවසාන ප්‍රශ්නය වෙසෙසින් වැදගත් වෙයි. මන්ද කිව හොත් ස්වේන් හා තැචර් යන මහාචාර්යවරුන්ගේ වැඩ සම්බන්ධයෙන් කටයුතු කරන විට කිසි ම දෙයක් නො තකා හැරිය නො හැකි හෙයිනි.

ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයෙහි මහාචාර්ය ජේම්ස් වයිට් සම්බන්ධයෙන් ස්වේන්ගේ සඳහන සලකා බලන කල්හි පැවසිය යුත්තේ ඔහු සුදුසු නො වන බව ය - මක් නිසා ද කිව හොත් ඔහුගේ කෘති ඇසුරු කර පුරුද්ද ඇත්තකු හට ට්‍රොට්ස්කි නමැති විෂය පිලිබඳ ව අධිකාරිත්වයෙන් යුතු විනිශ්චයකරුවකු හැටියට තබා විශ්වසනීයත්වයෙන් යුත් පුද්ගලයකු හැටියට වත් ඔහු පිලිගත නොහැකි හෙයිනි.[28]

තැචර් හට ඉතා ම රුචිකර තවත් මූලාශ්‍රයක් වන වැන් රී ගැන පැවසිය යුත්තේ ඉතිහාසඥයකු හැටියට ඔහුගේ කෘති වෙත එලඹිය යුත්තේ මුව වැස්මක් පැලඳ ගෙන නැතහොත් ප්‍රවේශම් සහගත ව බව ය. දැන් ඉතා දැඩි කොමියුනිස්ට් විරෝධියකු බවට පත් ව සිටින හිටපු මාඕ වාදියකු වන ඔහු 'ලෝක විප්ලවයඃ මාක්ස්ගේ සිට කිම් ඉල් සුං දක්වා කොමියුනිස්ට් ව්‍යාපාරය' නමැති කෘතියෙන් මෑත දී ලෙනින් හා ට්‍රොට්ස්කි පිලිබඳ ව පහත දැක්වෙන ඇගයීම ඉදිරිපත් කලේ යඃ

"එහෙත් සියල්ල සැලකිල්ලට ගත් කල් හි ඔව්හු ද චෞරයෝ, දේශපාලන මැරයන් රංචුවල නායකයෝ වෙත්. සිවිල් යුද්ධ ඇති කිරීමෙන් ඔවුහු සතුටට පත් වූහ. ඔවුන් රතු භීෂනය ප්‍රකාශයට පත් කලේ තමන් අරුම පුදුම ඓතිහාසික නාටකයක නලුවන් හැටියට පරිකල්පනය කර ගෙන ය. මැක්සිමිලියන් ඩි රොබෙස්පියර්ට කල නොහැකි වූ කටයුත්ත නැවත කිරීමේ වරප්‍රසාදය ඔවුන් සතු විය. තමන්ගේ වාසනාව පෙරලා දැමීමට සමත් විය හැකි කිසිවකු මේ වතාවෙහි ඉතිරි නො කිරීමට ඔවුහු අධිෂ්ඨාන සහගත වූහ. තමන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන හෝ මානව අයිතීන් පිලිබඳ ව හෝ බින්දු මාත්‍ර වශයෙන් සැලකිලිමත් නො වීම ගැන ලෙනින් හා ට්‍රොට්ස්කි ආඩම්බර වූහ. තම කෲරත්වය ක්‍රියාවට නැගීමෙන් ඔවුහු ඉමහත් සේ සතුටු වූහ." [29]

මෙම ප්‍රකාශනවල ගිනියම් වූ ස්වභාවය හැරුනු විට මෙයින් එකක් වත් විනය ගත ඓතිහාසික විනිශ්චයකට නිදසුන් වශයෙන් ඉදිරිපත් කල නො හැකි ය. පැහැදිලි ව පෙනී යන පරිදි මහාචාර්ය වැන් රී ප්‍රකුපිත මිනිසෙකි. ඔහු දේශපාලනික ප්‍රහාර කිහිපයක් ම විඳ දරා ගත්තෙකි. ලෙනින්-ට්‍රොට්ස්කි සම්බන්ධතාවය පිලිබඳ ව තීරනාත්මක විනිශ්චයක් දීමට ඔහුට සුදුසුකමක් ඇත්තේ නැත. කෙසේ වෙතත් මවිසින් මෙසේ පැවසිය යුතු ව ඇත. ඉහත උපුටා දැක්වුනු කෘතියෙහි වැන් රී කරන විස්තරයට අනුව ලෙනින් හා ට්‍රොට්ස්කි සාපරාධී ක්‍රියාවන්හි නිරත වීමෙහි ලා සගයෝ වූහ. එසේ ම ඔවුහු එක ම සාපරාධී ලෝක දෘෂ්ටියක් බෙදා හදා ගත්හ. මෙවන් දෘෂ්ටියක් දරා සිටිමින් වැන් රී කෙසේ නම් "ට්‍රොට්ස්කි ලෙනින්ගේ උරුමක්කාරයා වීය" යන සංකල්පය සුනු විසුනු කරන්න ද? තව ද ලෙනින් හා ට්‍රොට්ස්කි අතර සම්බන්ධතාව පිලිබඳ ව සාකච්ඡාවක දී "උරුමක්කාරයා" යන වචනයට ඇත්තේ නීතිමය ධ්වනියකට වඩා දේශපාලනික ධ්වනියකි. ට්‍රොට්ස්කි ලෙනින්ගේ "උරුමක්කාරයා" හැටියට සැලකිය හැකි ද නො හැකි ද යන ප්‍රශ්නය නිශ්චිත ව ම එලඹෙන දශක ගනනාවක ම ඉතිහාසඥයන් වාද විවාද කර ගන්නා විධියේ ප්‍රශ්නයක් වෙයි. එය එක රචනාවකින් විසඳා ගත හැකි විධියේ ප්‍රශ්නයක් නො වේ; වැන් රී මහතාට වඩා සැලකිය යුතු ප්‍රමානයකින් වැඩි කුශලතාවන්, දැනුම, අන්තර්-දෘෂ්ටිය හා විනිශ්චය ශක්තිය ඇති ලේඛකයකු ලියූ රචනයකින් වුව, එම ප්‍රශ්නය විසඳා ලිය නො හැකි ය. "ට්‍රොට්ස්කි, ලෙනින්ගේ උරුමක්කාරයා වීය යන සංකල්පය වැන් රී විසින් කුඩුපට්ටම් කරනු ලැබුනේ ය"යන්න අවධාරනයෙන් ඔප්පු වන්නේ එක ම එක කරුනකි; එනම්, ලෙනින් හා ට්‍රොට්ස්කි අතර පැවති සම්බන්ධය

පිලිබඳ ව මොනයම් බැරෑරුම් අධ්‍යයනයක දී වුව පැන නගින සංකීර්න ඓතිහාසික, දේශපාලනික, සමාජික හා න්‍යායික ප්‍රශ්න ගැන ස්වේන් ප්‍රමානවත් සැලකිලිමත් භාවයකින් සිතා නැති බව ය.

ට්‍රොට්ස්කි පිලිබඳ ව ස්වේන්ගේ ම ප්‍රකෝපකාරී මතය වනුයේ, ට්‍රොට්ස්කි "ජාත්‍යන්තරවාදියකු වනවා වෙනුවට තනි රටක සමාජවාදය ගොඩනැගීමේ හැකියාව දැඩි ලෙස විශ්වාස කල" බව ය. තම මතය සනාථ කරනුව ස්වේන්, මහාචාර්ය රිචඩ් ඩේ හට කරන කැඳවුම අපි දැන් විමසා බලමු. එබඳු අභූත ප්‍රකාශයක් සනාථ කරනුව මහාචාර්ය ඩේගේ අධිකාරය කැඳවුම් කෙරෙනු දුටු කල්හි මට මගේ දෙනෙත් අදහා ගත නො හැකි විය. මා පූර්වයෙන් සඳහන් කල මහත්වරුන්ට වෙනස් ව මහාචාර්ය ඩේ, කැපී පෙනෙන හා සම්මානනයට පාත්‍ර වූ ඉතිහාසඥයෙක් වෙයි. 1920 ගනන්වල සෝවියට් ආන්ඩුව තුල ආර්ථික පිලිවෙත සම්බන්ධයෙන් ඇති වූ අරගල පිලිබඳ ව මහාචාර්ය ඩේ, දශක ගනනාවක් මුලුල්ලේ බැරෑරුම් පර්යේෂන කර ඇත. විශේෂිත ව පැවසුවොත් ඔහු ඊ.ඒ. ප්‍රියෝබ්‍රැෂන්ස්කිගේ පර්යේෂන බැරෑරුම් විශ්ලේෂනයකට පාත්‍ර කර ඇත. එසේ කිරීමෙන් මහාචාර්ය ඩේ, ආර්ථික න්‍යාය හා පිලිවෙත සම්බන්ධයෙන් වාම විරුද්ධ පක්ෂය තුල බල පැවැත්වූ වැදගත් මතභේද මත ආලෝකය පතිත කර තිබේ.

ඩේ සම්බන්ධයෙන් ස්වේන්ගේ සඳහනෙහි විකෘති කරනයන් සේ ම ව්‍යාජ කරනයන් ද වෙයි. ස්වේන් විසින් උපුටා දක්වෙන කෘතිය "ලියොන් ට්‍රොට්ස්කි හා ආර්ථික හුදකලාවේ දේශපාලනය" යි. ඩේ, එම කෘතියෙහි, ට්‍රොට්ස්කි තනි රටක සමාජවාදය ගොඩනැගීමට ඇති හැකියාව ප්‍රතික්ෂේප නො කල බවට ඇඟවුම් කරන ඇතැම් සූත්‍ර ගත කිරීම් උපයෝග කර ගනියි. ඔහුට අනුව, ට්‍රොට්ස්කි විරුද්ධ වූයේ, තනි රටක සමාජවාදය, ස්ටැලින් යෝජනා කල පරිදි, කතිපයාධිකාරයක පදනම මත අත් පත් කර ගත හැකි ය යන සංකල්පයට ය. තව ද "තනි රටේ සමාජවාදය" ගැන ට්‍රොට්ස්කිගේ ආස්ථානය පිලිබඳ ව ඩේ කරන සාකච්ඡාව, කියවිය යුත්තේ සෝවියට් ආර්ථික පිලිවෙත පිලිබඳ ව පොතෙන් කෙරෙන ඉදිරිපත් කිරීම පිලිබඳ සන්දර්භයෙහි පිහිටුවමිනි. කෙසේ වෙතත් ස්වේන්, ඩේ විසින් ඔහුගේ කෘතියෙහි ආරම්භක පිටුවල උපයෝග කොට ගෙන තිබෙන නිශ්චිත අර්ථ නො දනවන වගන්ති කිහිපයක් ඩැහැ ගෙන තිබේ; එසේ ඩැහැ ගෙන "ලියොන් ට්‍රොට්ස්කි හා ආර්ථික හුදකලාවේ දේශපාලනය" නමැති කෘතියේ මූලික විශ්ලේෂන මාර්ගය විකෘත කිරීමට යොමු වෙයි. ඩේගේ තර්කනයෙහි කෙබඳු සීමාසහිතකම් පැවතියත් ට්‍රොට්ස්කි ජාත්‍යන්තරවාදියෙක් නො වේ ය යන ස්වේන්ගේ ප්‍රකාශයට පිටුබලය සපයන කිසි ම දෙයක් එහි ඇත්තේ නැත.[30] මෙය "ලියොන් ට්‍රොට්ස්කි හා ආර්ථික හුදකලාවේ දේශපාලනය" නමැති කෘතියෙන් ඉදිරිපත් කෙරෙන තර්කය නග්න ලෙස විකෘත කිරීමකි.[31]

වැලන්ටිනෝව් ගැන කෙරෙන සඳහන නිෂ්ප්‍රභ කිරීමට මම මගේ කාලය අපතේ නො යවමි. වැලන්ටිනෝව් පරන මෙන්ෂෙවිකයකු හා ට්‍රොට්ස්කිගේ කර්කෂ ප්‍රතිවාදියෙක් වෙයි. ස්වේන් වැලන්ටිනෝව්ගෙන් සැබෑ උද්ධෘත පාඨයක් පවා ගෙන හැර නො දක්වයි. මෙම ප්‍රකාශයට පිටුබලය සපයන කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකෙරේ. "රහසි ගත රැස්වීමක දී තහවුරු කර ගන්නා ලද ගිවිසුමක්" පිලිබඳ වැලන්ටිනොව්ගේ කතාව ගැන කිව යුත්තේ එය " කාලයේ අභියෝගය දරා සිටීමෙහි අපොහොසත් වීය" යනුවෙන් ස්වේන් ම ප්‍රකාශ කරන බව ය. වෙනත් වචනවලින් පවසතොත් එය ප්‍රලාපයකි. එසේ නම් ස්වේන් එය ඉස්මතු කරනුයේ කුමක් හෙයින් ද?

## දෙඩවිලි සහගත ජාත්‍යන්තරවාදය

ස්වේන්, තමන් විසින් ම අවිශ්වසනීය යැයි පිලිගැනෙන මූලාශ්‍ර ඉදිරිපත් කිරීමෙන් ඓතිහාසික වාර්තාව සම්බන්ධයෙන් තමන් තුල බල පවත්වන නරුම ආකල්පය ප්‍රකට කරයි. ට්‍රොට්ස්කිගේ ජීවිතය පිලිබඳ ව ප්‍රකට හා ලේඛන ගත සියලුම කරුනුවලට පටහැනි වන ප්‍රකාශ කිරීම පිලිබඳ ව ඔහුට පසුබෑමක් ඇත්තේ නැත. "ට්‍රොට්ස්කි ලෝක විප්ලවය විශ්වාස කලේ ය; එහෙත් ඒ අනෙක් බොල්ෂෙවික්වාදීන්ට වැඩියෙන් හෝ අඩුවෙන් නො වේ. සෙසු බොල්ෂෙවිකයන් සම්බන්ධයෙන් මෙන් ම ට්‍රොට්ස්කි සම්බන්ධයෙන් ද මෙය බොහෝ දුරට ම දෙඩවිලි සහගත ජාත්‍යන්තරවාදයක් විය."[32] වෙනත් වචනවලින් පවසතොත්, මොලටෝව්, වොරෂිලොව් හා ස්ටැලින් යන අයගේ සිතුවිලි හා ක්‍රියාකාරීත්වයන්හි ලෝක විප්ලවය පිලිබඳ ඉදිරි දර්ශනය දැරුවාට වැඩි තැනක් ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවන කටයුතුවල ලෝක විප්ලවය පිලිබඳ ඉදිරි දර්ශනයට නො තිබුනේ ය! කෙනෙකු මේ පරිමානයේ අභූතයකට පිලිතුරු දීම අරඹනුයේ වත් කෙසේ ද?

අවුරුදු හතලිහකට වැඩි කාල පරිච්ඡේදයක් මුලුල්ලේ ට්‍රොට්ස්කිගේ දේශපාලනික ජීවිතය පරිපාලනය කල දේශපාලනික සංකල්ප, එසේ ම අපමන දේශන හා ලිඛිත පිටු දහස් ගනනක්, බැරෑරුම් බුද්ධිමය, භාවමය හා සදාචාරමය අන්තර්ගතයකින් තොර හුදු බාහිර මවා පෑමක් පමනක් වී යැයි පාඨකයන් විශ්වාස කල යුතු ය. සියල්ල ම හුදු දේශපාලනික මවා පෑමක්

පමනක් විය; ට්‍රොට්ස්කි සෝවියට් සංගමය තුල කර ගෙන ගියා වූ කන්ඩායමික බල අරගලයට සම්බන්ධිත සාරාර්ථ වශයෙන් ජාතිකවාදී වූ ඕනෑ

එපාකම්වලට හුදු ආවරනයක් පමනක් විය. ස්වේන් මෙසේ ලියයි:

"1923 අසාර්ථක ජර්මානු විප්ලවය පිලිබඳ ව ඔහුගේ විවේචනය, සරල ව ම, එවකට ඔහුගේ දේශීය ප්‍රතිවාදීන් ව සිටි සිනොවියෙව්ට හා කමනෙව්ට එල්ල කල ප්‍රහාරයට ආවරනයක් පමනක් විය. බ්‍රිතාන්‍ය මහා වැඩ වර්ජනය පිලිබඳ ඔහුගේ විවේචනයත් එසේ ම ය. වෙනසකට ඇත්තේ එහි දී ඔහුගේ ප්‍රතිවාදීන් බුකාරින් හා ස්ටැලින් වීම ය. 1927හි දී චීනය පිලිබඳ ව ඔහුට ඇති වූ උනන්දුව ගත්ත ද එයත් පර්යාපථයෙන් සාරාර්ථ වශයෙන් දේශීය විය....1933 පිටුවහලෙහි දී, තමන් විසින් තර්මිඩෝරය පිලිබඳ සංකල්පය වල දමනු ලැබීමෙන් පසු ව පමනි, ට්‍රොට්ස්කි, යුරෝපය තුල කම්කරු පන්ති ව්‍යාපාරයේ පුනර්ජීවනයක්, සෝවියට් සංගමය මත යහපත් බලපෑමක් ඇති කොට කම්කරු රාජ්‍යයේ පරිහානිය නතර කරනු ඇතැයි යන සංකල්පය ගවේශනය කලේ, එවිට ජාත්‍යන්තරවාදය ඔහුගේ ව්‍යාපාරයට කේන්ද්‍රීය විය."[33]

තම ශිෂ්‍ය පාඨකයන්, සාකච්ඡාවට බඳුන් කෙරෙන සිද්ධි හා ගැටලු පිලිබඳ ව මුලුමනින් ම නො දැනුවත් යැයි ස්වේන් පැහැදිලි ලෙස ම සිතා සිටී. ඔහු තමන්ගේ නිගමනයට පිටුබලය සපයන සාධක ස්වරූප ගත් සාක්ෂි කිසිවක් ඉදිරිපත් නො කරයි. ට්‍රොට්ස්කිගේ කෘති පිලිබඳ විශ්ලේෂනයක පදනමෙහි පිහිටා තම තර්කනයට පිටුබලය සැපයීමට ද ඔහු යත්න දරන්නේ නැත. මෙම කැපී පෙනෙන අඩුපාඩුවෙන්, ලේඛකයකු හැටියට ට්‍රොට්ස්කි පිලබඳ ව ස්වේන් තුල සාමාන්‍ය වශයෙන් උනන්දුවක් නොමැති බව පිලිබිඹු වෙයි. තමන් විසින් ලිඛිත ජීවන චරිතය මහාචාර්ය බරුච් නී-පාස්ගේ "විශිෂ්ට" කෘතිය - "ලියොන් ට්‍රොට්ස්කිගේ සමාජික හා දේශපාලන චින්තනය" - ගැන සඳහනක් නො කරන බව තම පාඨකයන් හට දැන්වීමට ස්වේන් වග බලා ගනියි. මෙය ට්‍රොට්ස්කි පිලිබඳ ව අධ්‍යයනය කරන්නන් හට පුදුමයට හේතුවක් විය හැකි බව ස්වේන් පිලිගනී. එහෙත් ඔහු තමන්ගේ මෙම ක්‍රියාවට හේතු යුක්ති දක්වනුයේ, නී-පාස් ට්‍රොට්ස්කිගේ රචනාවන්ට අවශ්‍ය පමනට වැඩි වැදගත්කමක් අත්පත් කර දෙන්නේ යැයි පැවසීමෙනි: "නී-පාස් ට්‍රොට්ස්කිගේ ලියවිලි යම්යම් තේමාවන් යටතේ ගොනු කරයි; ඔහු ට්‍රොට්ස්කිගේ මුල් කාලීන හා පසු කාලීන රචනා පිලිවෙලකට සකස් කරයි; මෙම සැකසීම විසින් ට්‍රොට්ස්කි සැබවින් සිටියාට වඩා බෙහෙවින් ශ්‍රේෂ්ඨ චින්තකයකු බවට පත් කෙරේ. ට්‍රොට්ස්කි දැවැන්ත ප්‍රමානයක් ලිව්වේ ය. පුවත්පත් කලාවේදියකු හැටියට ඔහු තමන් ඉතා අඩුවෙන් දැන සිටි විෂයන් ගැන ලිවීමෙන් සතුටට පත් විය."[34]

ඉතිහාසඥයකු මෙබඳු නිරපේක්ෂ විනිශ්චයක් කරන කල්හි තමන්ගේ ප්‍රකාශය සනාථ කරනු වස් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂිත ය. ට්‍රොට්ස්කි තමන් විසින් සාකච්ඡා කෙරෙන විෂය ගැන කිසිවක් නො දැන සිටි බව පෙන්නුම් කෙරෙන විශේෂිත රචනා හෝ ලේඛනයක් මගින් ස්වේන් තමන්ගේ ප්‍රකාශයට පිටුබලය සැපයිය යුතු ය. ස්වේන් තමන්ගේ තර්කනයට පිටුබලය සපයන එක ද උද්ධෘත පාඨයක් ගෙන හැර දැක්වීමෙහි අපොහොසත් වෙයි. ඒ වෙනුවට ඔහු දිගින් දිගට ම තම මතයෙහි ම පිහිටා සිටියි. "ට්‍රොට්ස්කිට මැනවින් ලිවීමට පුලුවන් විය; එහෙත් ඔහු දාර්ශනිකයකු නම් නො වේ."[35] සත්‍යය නම්, ට්‍රොට්ස්කි තමන් දාර්ශනිකයකු වන බවක් කිසි ම විටක නො පැවසීම යි. එහෙත්, එයින්, ට්‍රොට්ස්කි තමන් ජීවත් වූ යුගයෙහි සමාජමය දේශපාලනික හා ආර්ථික යථාර්ථයන් තම පරම්පරාවෙහි දාර්ශනිකයන්ට වඩා ගැඹුරින් හා නිශ්චිත ව ග්‍රහනය කර ගැනුමෙන් වැලැක්වුනේ නැත. විසි වන සිය වසෙහි අධිරාජ්‍යවාදයෙහි හා ෆැසිස්ට්වාදයෙහි ස්වභාවය ට්‍රොට්ස්කිට වඩා මැනවින් වටහා ගත්තෝ කවරහු ද? හිට්ලර්ට තමන්ගේ පක්ෂපාතිත්වය සාඩම්බර ලෙස ප්‍රකාශ කර සිටි මාර්ටින් හයිඩෙගර් ද ට්‍රොට්ස්කි ද? බ්‍රිතාන්‍යයේ ෆේබියන් ප්‍රතිසංස්කරනවාදයේ බංකොලොත් භාවය පිලිබඳ ව වඩා ගැඹුරු හා පැහැදිලි දැක්මක් ඇති ව සිටියේ බර්ට්‍රම් රසල් ද ට්‍රොට්ස්කි ද?[36]

ලේඛකයකු හැටියට ට්‍රොට්ස්කිගේ කීර්ති නාමය පිලිබඳ ව කෙරෙන විශ්ලේෂනයක, වඩා අවංක හා ශක්‍යතා සම්පන්න ඉතිහාසඥයකු, ශ්‍රේෂ්ඨ ජර්මානු සාහිත්‍ය විචාරක වෝල්ටර් බෙන්ජමින්ගේ දිනපොත්වලින් උපුටා ගැනුනු පහත දක්වෙන උද්ධෘතය ඇතුලත් කිරීමට ඉඩ තිබුනි. "ජූනි 3, 1931 .... පෙර දින සැඳෑවෙහි කැෆේ ඩු සෙන්ටර්හි දී බ්‍රෙෂ්ට්, බ්‍රෙන්ටානෝ හා හේස් සමග සාකච්ඡාවක්. සාකච්ඡාව ට්‍රොට්ස්කි වෙත යොමු වුනේ ය; ට්‍රොට්ස්කි ජීවතුන් අතර සිටින ශ්‍රේෂ්ඨතම යුරෝපීය ලේඛකයා යැයි සිතන්නට හොඳ හේතු සාධක පවතින බව බ්‍රෙෂ්ට් කියා සිටියේ ය."[37] යම් හෙයකින් කැෆේ ඩු සෙන්ටර්හි සාකච්ඡාවට ස්වේන් ද සම්බන්ධ වී නම් ඊට ඔහු කෙබඳු ප්‍රතිපදානයක් කරනු ඇත් දැයි හුදෙක් පරිකල්පනය කිරීමට පමනක් කෙනෙකුට පුලුවන. "ඔව්, බර්ටෝල්, ඇතැම්විට එසේ විය හැකි ය; එසේ වෙතත් ට්‍රොට්ස්කි දාර්ශනිකයෙක් නො වී ය!"

මුලු මහත් ජීවන චරිතය කියවා ගෙන යන්නෙක් ස්වේන්, ට්‍රොට්ස්කිගේ ලියවිලි සම්බන්ධයෙන් දක්වන නො තැකීම ගැන පුදුමයට පත් වෙයි. ට්‍රොට්ස්කිගේ බොහෝ වැදගත් ලේඛන පිලිබඳ ව යන්තම් සඳහන් කෙරෙනවා පමනි; ඇතැම් කෘති මුලුමනින් ම නො තකා හැරේ. සිවිල් යුද්ධයෙහි රතු හමුදාවේ ජයග්‍රහනය සම්බන්ධයෙන් ට්‍රොට්ස්කි ඉටු කල තීරනාත්මක කාර්ය භාරය ස්වේන් විසින් පිලිගැනෙන මුත් මිලිටරි න්‍යාය පිලිබඳ ව ට්‍රොට්ස්කිගේ වැදගත් කෘති ස්වේන් විසින් නො තකා හැරේ. මෙය සැලකිය යුතු මග හැරීමකි. මන්දයි කිව හොත් පසු කාලීන අවුරුදුවල ට්‍රොට්ස්කි හා ස්ටැලින්වාදී කන්ඩායම අතරෙහි ඇති වූ බොහෝ දේශපාලනික හා

න්‍යායික වෙනස්කම් මිලිටරි පිලිවෙත පිලිබඳ ව ඇති වූ මුල් කාලීන ගැටුම් විසින් පූර්වාපේක්ෂා කෙරෙන හෙයිනි.[38] කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ප්‍රථම සම්මේලන හතරට (1919-1922) ට්‍රොට්ස්කි විසින් සූදානම් කෙරුනු අපූරු ප්‍රකාශන හා දේශන පිලිබඳ ව සඳහනක් ඇත්තේ නැත. ඇමරිකානු අධිරාජ්‍යවාදය, ලෝක ආධිපත්‍යය පිලිබඳ ආස්ථානයට නැග ගැනුම හා පරිහානි ගත වන, පිහිට පතන යුරෝපයක් සමග ඇමරිකානු අධිරාජ්‍යවාදයේ වෙනස් වන සම්බන්ධය පිලිබඳ ව ට්‍රොට්ස්කිගේ දුර දක්නා විශ්ලේෂනය පිලිබඳ ව සඳහනක් නොමැත. එසේ වෙතත් එයින් "ට්‍රොට්ස්කි හට යුරෝපීය දේශපාලනය පිලිබඳ ව කිසි ම වැටහීමක් නො වී යැ"යි උජාරුවෙන් පැවසීමෙන් ස්වේන් වලක්වනු ලැබෙන්නේ නැත.[39] මේ අනුව කෙනෙකුට අයින්ස්ටයින් හට භෞතික විද්‍යාව පිලිබඳ ව කිසිදු අවබෝධයක් නො වී යැයි ලියන්නටත් පුලුවන් වනු ඇත! එබඳු හාස්‍යජනක කියමන්වලට ඇත්තේ එක ම එක අරමුනකිඃ එනම් ට්‍රොට්ස්කිගේ ජීවිතය හා කාල පරිච්ඡේදය පිලිබඳ ව හදාරා හුරුපුරුද්දක් නැති ශිෂ්‍යයන්ගේ මානසිකයන් බුද්ධිමය වශයෙන් අපසරනය කරවන අභූතයන්ගෙන් පිරවීම ය.

ට්‍රොට්ස්කි, "තනි රටේ සමාජවාදය" පිලිබඳ ස්ටැලින්වාදී ක්‍රියා මාර්ගයෙහි උද්යෝගිමත් පාක්ෂිකයකු බවට පරිවර්තනය කරවීමට ස්වේන් දරන උත්සාහය, ට්‍රොට්ස්කිගේ සැබෑ සංකල්ප අත්‍යන්තයෙන් විරූපී විකෘති කරනයකට හා සෘජු ව්‍යාජ කරනයකට නැංවීමක් වන්නේ ය. ස්වේන් මෙම සංකල්පයෙහි කර්තෘත්වය ලෙනින්ට පවරයි. ඔහු එසේ කරනුයේ නව ක්‍රියා මාර්ගය හඳුන්වා දෙනු පිනිස ස්ටැලින් කල දේශනයෙහි, 1915හි ලෙනින් රචනා කල ලිපියකින් උපුටා ගත් පාඨයක් ගැබ් කෙරී තිබීම මුල් කර ගෙන ය. ස්ටැලින් මෙම උද්ධෘතය සන්දර්භයෙන් උදුරා ගත් බව පැහැදිලි කිරීමට ඔහු අපොහොසත් වෙයි. රුසියාවේ සමාජවාදයෙහි ඉරනම ලෝක විප්ලවයට සම්බන්ධ කරමින් ලෙනින් අවධාරනයෙන් කල ප්‍රකාශ ඔහු විසින් තම රිසිය පරිදි නො තකා හැරේ. වඩාත් බැරෑරුම් වනුයේ, ස්වේන් තම මුග්ධ භාවය නිසා, පූර්න අනවබෝධය නිසා, නැතහොත් සැලසුම් සහගත ව, ලියොන් ට්‍රොට්ස්කිගේ අදහස් විකෘත කිරීම යි. 'සමාජවාදය කරා ද නැතහොත් ධනේශ්වර ක්‍රමය කරා ද' යන මාතෘකාව යටතේ ට්‍රොට්ස්කි 1925 පල කල ලිපි මාලාව ගැන සඳහන් කරමින් ස්වේන් අවධාරනය කරනුයේ එහි තර්කනය "පැහැදිලි බව ය. නිරවද්‍ය ආර්ථික පිලිවෙත අනුගමනය කෙරෙන්නේ නම් හා රාජ්‍ය කාර්මික ආයෝජන ක්‍රමික ව වේගවත් කෙරෙන්නේ නම් තනි රටේ සමාජවාදය ක්‍රියාත්මක විය හැකි ය."[40]

යමෙකු, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල සමාජවාදී ගොඩනැගීමට ආරම්භකත්වය දීම (ට්‍රොට්ස්කි එය පිලිගෙන ප්‍රකාශයට පත් කල අතර එය උනන්දු ද කලේ ය.) සෝවියට් රූපී ජාතිකවාදයක දිගු කාලීන පැවැත්ම හා අනන්‍ය කල හොත් ආර්ථික පිලිවෙත පිලිබඳ විවාදයේ න්‍යායික අන්තර්ගතය හා දේශපාලනික ඇඟවීම් වටහා ගත නොහැකි වන තත්වයකට පත් වන්නේ ය. 'සමාජවාදය කරා ද නැතහොත් ධනේශ්වර ක්‍රමය කරා ද' යන 1925 ලිඛිත කෘතියෙහි පවා, තවමත් තමන් සෝවියට් ආර්ථික පිලිවෙතෙහි න්‍යායික පදනමේ ජාතිකවාදී නැඹුරුවෙහි ඇඟවීම් සලකා බලමින් සිටිය දී ට්‍රොට්ස්කි පැහැදිලි ලෙස ම අනතුරු ඇඟවූයේ, ලෝක ධනේශ්වර ක්‍රමයේ දිගු කාලීන පැවැත්මෙහි අර්ථය වනුයේ "පසුගාමී රටක සමාජවාදය බලගතු අනතුරුවලට මුහුන පාන බවට ය."[41] 1926 සැප්තැම්බරයෙහි දී ට්‍රොට්ස්කි මෙසේ ප්‍රකාශ කලේ ය. "විරුද්ධ පක්ෂය අප රටෙහි සමාජවාදයේ ජයග්‍රහනය ගැන ගැඹුරින් ඒත්තු ගෙන සිටිනුයේ අප රට ලෝක ආර්ථිකයෙන් කඩා වෙන් කල හැකි නිසා නො ව, ලොව පුරා කම්කරු පන්ති විප්ලවයේ ජයග්‍රහනය සහතික කල හැකි නිසා ය."[42] වෙනත් වචනවලින් පවසතොත් රුසියාවෙහි සමාජවාදය ගොඩනැගිය හැකි වනුයේ එහි දේශ සීමාවන්ගේ ඔබ්බෙහි විප්ලවීය අරගලවල දී කම්කරු පන්තිය බලය අත්පත් කර ගත හොත් පමන ය. 1926 නොවැම්බර් පලමුවෙනි දා 15 වන සම්මේලනයට ට්‍රොට්ස්කි කල කතාව ජාතික සමාජවාදයේ ඉදිරි දර්ශනයට එල්ල කරන ලද සුවිශද ප්‍රහාරයකි.[43] 'තනි රටේ සමාජවාදය' ගැන ගැටලුව පිලිබඳ ව නිරවද්‍ය ලෙස සලකා බැලීමට පිරික්සිය යුතු වන මෙම ලේඛනයත් වෙනත් අතිශයින් ම තීරනාත්මක ලේඛනත් ස්වේන් විසින් සත්තකින් ම නො තකා හැරේ.

## 1923 පිලිබඳ ව ස්වේන්

සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ පරිහානියට එරෙහි ව ට්‍රොට්ස්කිගේ අරගලයෙහි තීරනාත්මක ආරම්භක වටය පිලිබඳ ව ස්වේන්ගේ ලියවිල්ල, ඉස්මතු වෙමින් පැවති ස්ටැලින්වාදී කන්ඩායම ට්‍රොට්ස්කිගේ විවේචනවලින් ආරක්ෂා කිරීමට වැඩි යමක් වෙතොත් යන්තමිනි. ට්‍රොට්ස්කි 1923 දෙසැම්බරයෙහි මුල දී 'ද නිව් කෝස්' යන මාතෘකාව යටතේ රචනා කල ලියුම හා ලිපි මාලාව ස්වේන් විසින් ගර්හාවට පාත්‍ර කරනු ලැබීම වෙසෙසින් වැදගත් වෙයි. ස්වේන් මෙසේ ලියයිඃ

"දෙසැම්බර් 8 වෙනි දා ලියන ලදුව යම් යම් බාධා කිරීම්වලින් පසු ව 1923 දෙසැම්බර් 11 වෙනි දා 'ප්‍රව්ඩා' පුවත්පතෙහි පල කෙරුනු 'ද නිව් කෝස්' නමැති ක්‍රියා මාර්ගික රචනයෙන් ට්‍රොට්ස්කි, පක්ෂයේ එන්ට එන්ට ම වැඩි වැඩියෙන් නිලධාරි තාන්ත්‍රික වන නායකත්වය හෙලා දුටුවේ ය. පැරනි ස්ථාපිත නායකත්වය, බාල පරපුරක් සමග ගැටෙන බව ට්‍රොට්ස්කි එහි දී අවධාරනය කලේ ය. ඔහු තමන් බෙහෙවින් ප්‍රිය කලා වූ අතිශයෝක්ති සහගත සසැඳීමකින් බොල්ෂෙවික්

නායකයන් අතරෙහි පැවති තත්වය, ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඉතිහාසයෙහි මාක්ස් හා එංගල්ස්ගේ කලක් රැඩිකල්වාදී වූ මිතුරන් දැනෙන නොදැනෙන පරිද්දෙන් ප්‍රතිසංස්කරනවාදයේ පිතෘවරුන් සේ නව කාර්යභාරයකට රූටා ගිය සමය හා සමාන කලේ ය. එය හොඳ පරිකල්පන රූපයකි. එහෙත් කමනෙව්ට, ස්ටැලින්ට හා සිනොවියෙව්ට තමන් හුදු ප්‍රතිසංස්කරනවාදීන් වන අතරෙහි ට්‍රොට්ස්කි පමනක් එකම සැබෑ විප්ලවවාදියා වන්නේ ය යනුවෙන් කෙරෙන ඇඟවීමක් රුචි කර වන්නට එතරම් ඉඩක් ඇත්තේ නැත.

'ද නිව් කෝස්' රචනා කිරීමෙන් ට්‍රොට්ස්කි හුදෙක් තම දේශපාලන මන්ඩලික මිතුරන්ට අපහාස කලා පමනක් නො වේ; බොල්ෂෙවික් වචනවලින් පවසතොත් ඔහු සදාචාරාත්මක වශයෙන් ඔවුන් ඉහල අධිකාරිත්වයකට ද නැංවී ය. ඔහු එකඟතාවකට එලඹ අනතුරු ව එය බිඳ දැම්මේ ය. බ්‍රෙස්ට් ලිටොව්ස්ක් අර්බුදයේ උච්ච අවස්ථාවෙහි දී ඔහු ලෙනින් සම්බන්ධයෙන් ද එසේ කලේ ය. වෘත්තීය සමිති විවාදය පවතිද්දී ඔහු සිනොවියෙව් කොමිසමට සම්බන්ධ වූයේ තමන් එහි වැඩ කටයුතුවලට සහභාගි නො වන බව පැවසීමට ය. දශ වන පක්ෂ සම්මේලනයෙහි දී අනුමත කර ගැනුනු කට්ටිවාදයට විරුද්ධ යෝජනාව, විශේෂිත ව මෙවැනි හැසිරීම් වලක්වාලීම අරමුනු කර ගත්තේ ය. 1923 ශරත් සෘතුවෙහි ට්‍රොට්ස්කිගේ හැසිරීම කට්ටිවාදයට සමීපසථ වීද යන්න විවාදයට බඳුන් කල හැකි ය. එහෙත් ද නිව් කෝස් සැකයකින් තොර ව ම කට්ටිවාදී විය. ඔහු සම්මුතියක් උදෙසා අත්සන් තැබී ය; ඉක්බිති ව එය බිඳ දැමුවේ ය. එසේ කිරීමෙහි දී තම දේශපාලනික සහෝදරවරුන්ගේ විශ්වාසවන්ත භාවයට අභියෝග කලේ ය."[44]

ස්වේන් මෙහි දී ඉදිරිපත් කරනුයේ සෝවියට් කොමියුනිස්ට් පක්ෂය තුල පුපුරා ගිය ගැටුමෙහි මූලාශ්‍රයන්, ඒ හා සම්බන්ධිත ගැටලු හා සිද්ධීන්, පිලිබඳ ව වෛෂයික විස්තරයක් නො වේ; ඒ වෙනුවට ට්‍රොට්ස්කිගේ විවේචනයට පාත්‍ර වූවන් පිලිබඳ ව තමන්ගේ ම බෙහෙවින් පාක්ෂික ආරක්ෂා කිරීමක් ස්වේන් විසින් ඉදිරිපත් කෙරේ. 1918 බ්‍රෙස්ට් ලිටොව්ස්ක් අර්බුදය සමයෙහි හා 1920 වෘත්තීය සමිති ගැටුම සමයෙහි ට්‍රොට්ස්කිගේ හැසිරීම පිලිබඳ ව ස්වේන් කේන්තියෙන් කරන සඳහන් කිරීම් කෙනෙකුට කියවෙනුයේ ස්ටැලින්ගේ ම කතාවලින් කොපි කර ගන්නා ලද පිටපත් මෙනි. කමනෙව්, සිනොවියෙව් හා ස්ටැලින් ට්‍රොට්ස්කිගේ විවේචන "රස

විඳීමට සූදානම් වූවෝ නො වූහ"යි ස්වේන් ප්‍රකාශ කරයි. ඔහු එසේ ප්‍රකාශ කරනුයේ ට්‍රොට්ස්කි 'ද නිව් කෝස්' හි ලියූ දේ එමගින් අවලංගු කෙරෙන්නාක් මෙනි.

2006 හි ලියන ඉතිහාසඥයකු, 20 වන සියවසෙහි යුග කාරක ගැටුම්වලින් එකක් බවට පත් වීමට නියමිත ගැටුමක් දියත් කිරීම සම්බන්ධයෙන් ට්‍රොට්ස්කිට "කට්ටිවාදී" යැයි චෝදනා කිරීම අඩු ම මට්ටමින් පැවසුව හොත් අපූරුවකි. ආපස්සට විමර්ශනය කිරීමේ වාසිය භුක්ති විඳින ස්වේන්, යථා කාලයෙහි මේ සියල්ල දිග හැරෙනුයේ කෙසේ දැයි දැන සිටී. ට්‍රොට්ස්කි විරෝධය පෑ පක්ෂාභ්‍යන්තරික ප්‍රජාතන්ත්‍රවාදය මැඩීම, යථා කාලයෙහි මහා ජන ඝාතන ක්‍රියාත්මක කරන මිනීමරු අධිපතිවාදී ඒකාධිපතිත්වයක් බවට පත් විය. ට්‍රොට්ස්කිගේ විවේචනවලින් කමනෙව්ගේ හා සිනොවියෙව්ගේ හිත් මඳක් රිදුනේ නම්, 13 වසරකට පසු ව මේ පැරනි බොල්ෂෙවිකයන් දෙදෙනා ස්ටැලින් අතින් ඊට වඩා බෙහෙවින් රුදුරු ඉරනමකට මුහුන පෑවෝ ය. තව ද පැරනි බොල්ෂෙවික් නායකයන් පරපුරෙහි දේශපාලනික පරිහානිය පිලිබඳ ව ට්‍රොට්ස්කිගේ අනතුරු ඇඟවීම "අතිශයෝක්ති සහගත යැ" යි ස්වේන් එල්ල කරන ප්‍රහාරය විශ්වාස කල නො හැකි තරම් ය. ට්‍රොට්ස්කි විසින් ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නිදර්ශනය ගෙන හැර දැක්වීම, ඉතිහාසය විසින් අතිශයින් ම බේදජනක ආකාරයට ප්‍රදර්ශනය කෙරුනු පරිදි, බොල්ෂෙවික් පක්ෂය හමුවෙහි පැවති බේදවාචකයේ පරිමාව අවතක්සේරු කිරීමකි.

ද නිව් කෝස් රචනා කිරීම නුසුදුසු හා කන්ඩායම්වාදී ක්‍රියාවකි යන විශේෂිත චෝදනාව ගැන කුමක් කිව හැකි ද? එය ඓතිහාසික වාර්තාව අවංක ව කියවීම මත පාදක

කෙරුනක් නො වේ. ස්ටැලින්, සිනොවියෙව් හා කමනෙව් විසින් තනා ගන්නා ලද රහසිගත කන්ඩායමක් දේශපාලන මන්ඩලය තුල ආධිපත්‍යය ඉසිලූ බව ස්වේන් පහසුවෙන් ම අමතක කරයි; මෙම කන්ඩායම ක්‍රියා මාර්ගික එකඟතාවක් මත නො ව, ඊට වඩා, ට්‍රොට්ස්කිගේ දේශපාලනික බලපෑම පිරිහෙලීමේ පොදු අධිෂ්ඨානයක් මත පාදක කෙරී තිබුනි. මේ අනුව ට්‍රොට්ස්කි වැඩ කරමින් සිටියේ ස්ටැලින්, සිනොවියෙව් හා කමනෙව් විසින් කල් තබා තිරය පිටුපස සකස් කෙරුනු එකඟතාවන් විසින් කිලුටු වූ දේශපාලන මන්ඩලයක් තුල ය. තව ද 1954හි දී ඊ.එච්. කාර් විසින් විශද ලෙස පැහැදිලි කෙරුනු පරිදි ට්‍රොට්ස්කිගේ දෙසැම්බර් 8 ලිපිය - 'ද නිව් කෝස්' නමින් දන්නා ලැබෙන ලේඛන මාලාවෙන් කොටසකි - සම්පූර්න වශයෙන් ම මූලධර්මාත්මක ස්වභාවයක් උසුලන්නකි.

"ලිපිය, දෙසැම්බර් 5 යෝජනාවට ලියන ලද අටුවාවක රූපාකාරය ගත්තේ ය: යෝජනාවෙන් යම් අර්ථයක් ප්‍රකාශයට පත් වූයේ යැයි ට්‍රොට්ස්කි සැලකුවේ ද, ලිපිය ඒ ගැන රචිත විවරනයක් විය. එසේ ම එය, ඉදිරිපත් විය හැකි වෙනත් නිර්වචන නිශ්ප්‍රභ කිරීමක් ද විය. එය පසුකලෙක මවා පාන ලද පරිදි පිලිගැනුනු පාඨ ග්‍රන්ථයකට හෝ දේශපාලන කමිටුවෙහි හා මධ්‍යම කාරක සභාවෙහි අනෙක් සාමාජිකයන්ට සිතාමතා

එල්ල කරන ලද ප්‍රහාරයක් ද නො වී ය. ලිපියෙහි ගැබ් වුනු අදහස් උදහස්, ට්‍රොට්ස්කි සරල මතික ව විශ්වාස කල පරිදි, තමන් තම සගයන්ට බෙදා හදා ගැනුමට බල කල අදහස් උදහස් විය. ට්‍රොට්ස්කිගේ අදහසට අනුව, ලිපියෙන් කෙරුනු එක ම දෙය යෝජනාවෙහි අකුරු නිවැරදි කිරීමත් ඔහුගේ ජයග්‍රහනය තහවුරු කිරීමත් පමනි."[45]

ස්ටැලින්, සිනොවියෙව් හා කැමනෙව් ත්‍රිත්වයත් ට්‍රොට්ස්කිත් පක්ෂය ප්‍රතිසංස්කරනය කිරීම පිලිබඳ ව 1923 දෙසැම්බර් 5 යෝජනාව වෙත එලඹුනේ එකිනෙකට බෙහෙවින් වෙනස් වූ අරමුනු හා නිර්නායකයන් ඇති ව බව කාර් වැඩි දුරටත් සඳහන් කරයි. ස්ටැලින්ට කැමනෙව්ට හා සිනොවියෙව්ට යෝජනාවෙහි සැබෑ අන්තර්ගතය ඉසිලුවේ දෙවන හෝ තෙවන වැදගත්කමකි. ට්‍රොට්ස්කි සමග එකඟත්වයකට පැමිනීමට ඔවුන් හට පැවති අවශ්‍යතාව බල අරගලයට සම්බන්ධිත හුදු උපාමාරුමය සලකා බැලීම් මත පාදක කෙරී තිබුනි. නායකත්වයේ එන්ටඑන්ට ම වැඩි වැඩියෙන් නිලධාරිවාදී වන හා අධිපතිවාදී වන විධික්‍රමවලට එරෙහි ව විරුද්ධත්වය ව්‍යාප්ත වෙත් ම ත්‍රිත්වය යත්න දැරුවේ මධ්‍යම කාරක සභාවෙන් ට්‍රොට්ස්කිගේ විවෘත බිඳී වෙන් වීම වලක්වාලීමට හෝ නැති නම් අඩු ගනනේ ප්‍රමාද කරවීමට ය. ඊට වෙනස් ව ට්‍රොට්ස්කි හට යෝජනාව, ඉහල මූල ධර්ම සම්බන්ධිත කරුනු ඉස් මතු කලේ ය. ට්‍රොට්ස්කි හා ඔහුගේ ප්‍රතිවාදීන් අතර වෙනස කාර් විසින් සටහන් කරනු ලැබින. "ට්‍රොට්ස්කි පුරුදු ව සිටියේ පක්ෂය තුල ඇති වන මතභේද පක්ෂ යෝජනා කෙටුම්පත් කිරීම මගින් අරගලයෙන් විසඳා ගැනුමට ය. එහෙයින් ඔහු ලේඛනයක් මගින් අත්පත් කර ගැනෙන ජයග්‍රහනය ට ප්‍රායෝගික වටිනාකමක් අත්පත් කර දුන්නේ ය. එහෙත් පක්ෂ නායකත්වය පිලිබඳ නව කොන්දේසි තුල එම ප්‍රායෝගික වටිනාකම තවදුරටත් නො පැවතියේ ය."[46]

කාර්ගේ මෙම ඇගයීම, ඉතිහාසඥ රොබට් වී ඩැනියල්ස් විසින් ඔහුගේ 'ද කොන්ෂන්ස් ඔෆ් ද රෙවලියුෂන්' නමැති බලපෑම් සහගත කෘතියෙන් ස්ථිර කෙරී ඇත. ද නිව් කෝස් ලිවීමට තුඩු දුන් සිද්ධීන් මාලාව පැහැදිලි කරමින් ඩැනියල්ස් මෙසේ ලියයිඃ " ට්‍රොට්ස්කි යෝජනාව පසුපස යන්තමින් සැඟ වී පැවති, තමන් කෙරෙහි වූ ද්වේෂය ගැන දැනුවත් වූයේ, දෙසැම්බර් 8 වෙනි දා පක්ෂ රැස්වීමකට ලියූ විවෘත ලිපියකින් ප්‍රතිසංස්කරනයේ ඇඟවීම් අවධාරනය කිරීමට යොමු විය. ද නිව් කෝස් ලිපිය, දෙසැම්බර් 5 වෙනි දා යෝජනාව උද්යෝගිමත් ලෙස ස්ථිර කිරීමක් හා පැහැදිලි කිරීමක් ද විය. යෝජනාව ක්‍රියාත්මක කිරීමෙහි ලා පක්ෂයේ නායකත්වයට හා අනුගාමිකත්වයට පැවරෙන කාර්ය භාරය මත එහි දී අවධාරනය යෙදුනි...."[47]

ස්වේන්ගේ විස්තරයෙන් මුලුමනින් ම තොර වූයේ ගැඹුරු වන දේශපාලනමය ගැටුම යටින් පැවති වෛෂයික සන්තතීන් පිලිබඳ විශ්ලේෂනයකි. සෝවියට් සංගමය තුල, නව ආර්ථික පිලිවෙතෙහි බල පෑම යටතේ ඇති වෙමින් පැවති වෙනස්කම් හා පක්ෂය තුල එහි පිලිබිඹුව පිලිබඳ ව කිසි ම තක්සේරුවක් ස්වේන් විසින් ඉදිරිපත් නො කෙරේ. ඔහු ට්‍රොට්ස්කිගේ විරුද්ධවාදීන් පිලිබඳ ව කිසි ම නිරූපනයක් -දේශපාලනික හෝ බුද්ධිමය - නො කරයි. ඔහු බොල්ෂෙවික් පක්ෂයේ වෙනස් වන සංයුතිය විභාග නො කරයි. ඔහු බොල්ෂෙවික් පක්ෂය හා සෝවියට් සමාජය කෙරෙහි එතරම් විනාශකාරී බලපෑම් ඇති කිරීමට නියමිත වූ නිලධාරි තාන්ත්‍රික කරනයේ ප්‍රපංචය පරීක්ෂා කර බලන්නේ නැත.

## ට්‍රොට්ස්කිගේ අන්තිම පිටුවහල පිලිබඳ ව ස්වේන්ගේ විස්තරය

ට්‍රොට්ස්කිගේ ජීවිතයේ අවසන් වසර දොලහට ස්වේන් විසින් වෙන් කෙරෙනුයේ පිටු විසි පහක් පමනි. එම වසර පිලිබඳ ව ඔහුගේ විස්තරය මතුපිටින් පමනක් විමසා බලා කරන ලද්දක් සේ ඇඟවීම ඔහුට කෙරෙන ප්‍රශංසාවක් වන්නේ ය. යුරෝපීය ඉතිහාසයෙහි පලමුවන ලෝක යුද්ධයට පසු ව ඇති වන වඩාත් ම විනාශකාරී සිද්ධිය එනම් ජර්මනිය තුල හිට්ලර් සහ ඔහුගේ නාසි පක්ෂය බලයට පැමිනීම ගැන සඳහනක් නො කෙරෙන තරම් ය. මෙම සිද්ධියත් ට්‍රොට්ස්කි විසින් ඔහුගේ අන්තිම පිටුවහලෙහි දී ගන්නා ලද ඉතාමත් ම වැදගත් දේශපාලනික තීන්දුත් අතරෙහි පවතින සම්බන්ධය කෙරෙහි ස්වේන් කිසි ම සැලකීමක් නො දක්වයි. එම දේශපාලනික තීන්දු නම්, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල දේශපාලන විප්ලවයක් උදෙසාත් හතර වන ජාත්‍යන්තරය ගොඩනැගීම උදෙසාත් ට්‍රොට්ස්කි කල ඉල්ලීම යි. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයෙන් පිටුවහල් කරනු ලැබීමෙන් අනතුරුව 1929හි දී ප්‍රින්කිපෝවලට

පැමිනි ට්‍රොට්ස්කි ඔහුගේ සහකරුවන්ගෙන් කොමියුනිස්ට් ජාත්‍යන්තරය තුල සිටින ලෙස ඉල්ලුම් කල බව සැකෙවින් සඳහන් කිරීමෙන් ඉක්බිති ව ස්වේන් මෙසේ ලියයිඃ "1933 වන විට ඔහු තම හිත වෙනස් කර ගත්තේ ය."[48] පිලිවෙතෙහි මෙම වෙනස ඇති කල සිද්ධිය පිලිබඳ ව සඳහනක් නො කෙරේ; එනම්, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ හා එහි ජර්මානු පක්ෂයේ පාවා දීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් හිට්ලර් බලයට පැමිනීම යි. ස්වේන්, ජර්මානු අර්බුදය ගැන ට්‍රොට්ස්කි කල රචනාවන් පිලිබඳ ව ඇගයීමක් නො කරයි. කෙනෙකු, මෙම විෂය පිලිබඳ ව නිශ්ශබ්දතාවකට සමාන වන ස්වේන්ගේ ප්‍රතිචාරය, ෆැසිස්ට් තර්ජනයට එරෙහි ව ජර්මානු කම්කරු පන්තිය නැගිටුවීමට ට්‍රොට්ස්කි දැරූ ප්‍රයත්න ගැන ඊ.එච්. කාර්ගේ ලියවිලි

සමග සසැඳීම ප්‍රමානවත් ය. තම අවසන් කෘතිය වූ 'ද ට්වයිලයිට් ඔෆ් ද කොමින්ටාන්' රචනා කිරීමෙහි දී, කාර්, 1931-33 ජර්මානු අර්බුදය පිලිබඳ ව ට්‍රොට්ස්කිගේ රචනා කෙතරම් වැදගත් කොට සැලකුවේ ද යත් එම විෂයට කැප වූ පසු ඇමුනුමක් තම කෘතියට ඇඳුවේ ය. කාර් මෙසේ ලිව්වේ යඃ හිට්ලර් බලයට පැමිනෙන කාල පරිච්ඡේදයෙහි ජර්මනියේ සිදුවීම් දාමය පිලිබඳ ව ට්‍රොට්ස්කි කෙතරම් නිරන්තර වූ හා අනාගත වක්තෘමය සටහනක් තැබුවේ ද යත් ඒ පිලිබඳ ව වාර්තාවක් තැබීම වටී."[49]

එසේ ම මොස්කව් අවනඩු හා ඉන් අනතුරුව ඇති වූ විරේක කිරීම් පිලිබඳ ව ලිවීමට ද කැප කෙරී ඇත්තේ වාක්‍ය කිහිපයකි. ප්‍රමානාත්මක ව පැවසුවොත් මෙක්සිකෝවෙහි දී ෆ්‍රීඩා කාලො සමග ට්‍රොට්ස්කිගේ පැවති කෙටි කාලීන සම්බන්ධයට වැය කෙරුනු ඉඩ ප්‍රමානයට වඩා බෙහෙවින් අඩු ඉඩ ප්‍රමානයකි. ට්‍රොට්ස්කිගේ වඩාත් වැදගත් දේශපාලනික ලියවිල්ල වන ද රෙවලියුෂන් බිට්‍රේඩ් ලිවීම පිලිබඳ ව සඳහන් වනුයේ එක් වැකියකි. ස්ටැලින්වාදීන්ගේ මහජන පෙරමුනු පිලිවෙත් ෆ්‍රැන්කෝගේ ජයග්‍රහනයට මාවත පාදන බවට අනතුරු අඟවන, ස්පාඤ්ඤ විප්ලවය පිලිබඳ ට්‍රොට්ස්කිගේ ආවේගී රචනා පිලිබඳ ව කිසි ම සඳහනක් නොමැත. සංක්‍රමන ක්‍රියා මාර්ගය, එනම් හතර වන ජාත්‍යන්තරයේ පාදක ලියවිල්ල ගැන සඳහන් නො කෙරේ. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ ස්වභාවය පිලිබඳ ට්‍රොට්ස්කි විසින් ලියන ලද අවසාන ශ්‍රේෂ්ඨ විවාදශීලී රචනා ද ස්වේන් විසින් නො තකා හැරේ. අවසාන වශයෙන්, ස්වේන් තම ජීවන චරිතය නිම කරනුයේ ට්‍රොට්ස්කි 1917 ඔක්තෝබර් විප්ලවයෙන් අනතුරුව දේශපාලනය අත්හැර දැමුවා නම් වඩා හොඳ බව පවසමිනි. ට්‍රොට්ස්කි කල යුතු ව තිබුනේ මුලුමනින් ම පුවත්පත් කලාවට කැප වීම යැයි ස්වේන් වැඩි දුරටත් සඳහන් කරයි. ස්වේන්ට අනුව ඒ මන්දැයි කිව හොත්, ස්වේන් දැනට මත් අපට ප්‍රකාශ කොට තිබෙන පරිදි, එවිට ට්‍රොට්ස්කිට "තමන් අඩුවෙන් දැන කියා ගත් දේවල් ගැන ලියන්නට" පුලුවන් වන හෙයිනි.

**සටහන්**

[21]. ට්‍රොට්ස්කි, ජෙෆ්රි ස්වේන් විසිනි (එක්සත් රාජධානිය 2006), පි. 1. මතු සඳහන් කෙරෙනුයේ ස්වේන් යනුවෙනි.

[22]. ට්‍රොට්ස්කි, ඉයන් ඩී. තැචර් විසිනි (ලන්ඩන් හා නිව් යෝක්, 2003), පි. i. මතු සඳහන් කෙරෙනුයේ තැචර් යනුවෙනි.

[23]. ස්වේන්, පි. 1.

[24]. තැචර්, පි. 15-16.

25ී ඩොයිෂ්චර් තම පාත්‍රයන්ගේ ඔලු තුලට සිතුවිලි ආරෝපනය කරන බවත් ඒවාට සාක්ෂ්‍ය නොමැති බවත් තැචර් ප්‍රකාශ කරයි. ඔහු නිදසුන් වශයෙන් පාඨයක් ගෙන හැර දක්වයි.

"මෙම ඡේදයෙන් ජර්මනිය සමග සාමය ඇති කර ගැනුම සම්බන්ධව බොල්ෂෙවිකයන් අතර හට ගත් මතභේද, විප්ලවීය යුද්ධයක් දියත් කරනවා ද, එසේ නම් ඒ කවුරුන්ට එරෙහි ව ද... යනුවෙන් පැරිස් කොමියුනයට ඇති වූ උභතෝකෝටිකය හා සමාන කරයි. ඉක්බිති ව තැචර් තම විරෝධයට පාත්‍ර වූ පාඨය ඉදිරිපත් කරයිඃ

"ප්‍රන්සය පිලිබඳ ප්‍රිස්මයෙන් බොහෝ විට රුසියානු රුසියානු විප්ලවය දෙස බැලූ ට්‍රොට්ස්කි මෙම සාදෘෂ්‍යය ගැන දැනුවත් වන්නට ඇත. ට්‍රොට්ස්කි තමන් ඩැන්ටන්ගේ කාර්ය භාරය සිහිපත් කරවීමෙහි සමත් වන කාර්ය භාරයක් ඉෂ්ට කරන බව සිතන්නට ඇත; ඒ අතර ලෙනින්ගේ කොටස රොබෙස්පියර්ගේ කොටසට සමාන යැයි ද සිතන්නට ඇත. තමන් හා ලෙනින් අතරෙහි මෙහොතකට ගිලටිනයේ සෙවනැල්ල වැටුනා සේ වන්නට ඇත.... ට්‍රොට්ස්කි හට මෙම සලකා බැලීම තීරනාත්මක විය. ගිලටිනයේ සෙවනැල්ල පිට මං කරනු පිනිස ට්‍රොට්ස්කි මූලධර්ම හා අභිවෘධි කාමය අපූර්ව අයුරින් පරිත්‍යාග කලේ ය."

කෙනෙකු තැචර්ගේ උද්ධෘතය, ඩොයිෂ්චර්ගේ ජීවන චරිතයේ එම ඡේදය හා සසඳා බලතොත්, ප්‍රබන්ධ කරනය පිලිබඳ චෝදනාව අත්‍යන්තයෙන් ම අනුචිත බව වහා ම වැටහෙයි. ඩොයිෂ්චර් විසින් බෙහෙවින් පැහැදිලි කෙරුන පරිදි ඔහු සාදෘෂ්‍යයක් උපයෝග කර ගත්තේ සංකීර්න දේශපාලනික මත භේදයක් පැහැදිලි කිරීම පිනිස ය. එම අවස්ථාවෙහි දී - සෝවියට් රුසියාව, බ්‍රෙස්ට් ලිටොව්ස්ක් හි දී ජර්මානු කොන්දේසි පිලිගත යුතු ද යන්න පිලිබඳ ව ලෙනින් සමග ඔහුට ඇති වූ ගැටුමෙහි දී - ට්‍රොට්ස්කි සිතන්නට ඉඩ ඇති දේ පිලිබඳ ව ඩොයිෂ්චර්ගේ ප්‍රතිනිර්මානය ඉතා මැනවින් ඓතිහාසික රචනය පිලිබඳ සීමාවන් තුල පිහිටයි. විශේෂයෙන් ම එසේ වනුයේ තමන් කිසියම් පරිකල්පනයක් කරන බව ඩොයිෂ්චර් විසින් පැහැදිලි කෙරෙන හෙයිනි. තැචර් විසින් අත් හැර දැමෙන කොටස් <u>- ඉටැලික් කොට ඇත -</u>

මෙසේ යඃ [5]"ට්‍රොට්ස්කි වෙනත් අයුරකින් ක්‍රියා කලේ නම් උද්ගත විය හැකි ව තිබූ තත්වයට සාද ෘෂ්‍යයක් ප්‍රන්ස විප්ලවය සමයෙහි පැරිස් කොමියුනය, ඩැන්ටන් හා රොබෙස්පියර් අතරෙහි වර්ධනය වූ තුන් කොන් අරගලය තුල දැක ගත හැකි වෙයි. 1793හි දී කොමියුනය (හා ඇනකාසිස් ක්ලූට්ස්) පෙනී සිටියේ බුකාරින් හා වාම කොමියුනිස්ට්වාදීන් පෙනී සිටි පරිදි යුරෝපයේ සියලුම ප්‍රතිවිප්ලවවාදී ආන්ඩුවලට එරෙහි ව යුද්ධය පිනිස ය. ඩැන්ටන් ප්‍රසියාවට විරුද්ධ ව යුද්ධයත් එංගලන්තය සමග එකඟතාවත් යෝජනා කලේ ය; ඩැන්ටන් සිතුවේ ෆොක්ස් විසින් පිට් තනතුරෙන් විස්ථාපනය කෙරෙනු ඇත කියා ය. රොබෙස්පියර්,

එංගලන්තයට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කරන ලෙස සම්මේලනයට බල කලේ ය; එසේ ම ඔහු ප්‍රසියාව සමග එකඟතාවකට ප්‍රයත්න දරී ය. කොමියුනයට එරෙහි ව ඩැන්ටන් හා රොබෙස්පියර් එකතු වූහ. එහෙත් ඔවුන් එය මැඩ පැවැත්වූ කල්හි ඔවුහු විරසක වූහ. ඔවුන් අතරෙහි වූ මතභේදය ගිලටිනය විසින් විසඳනු ලැබුනි.

"බොහෝවිට ප්‍රන්ස ප්‍රිස්මය තුලින් රුසියානු විප්ලවය දෙස බැලූ ට්‍රොට්ස්කි, මෙම සාද ෘෂ්‍යය ගැන දැනුවත් වන්නට ඇත. යුද්ධයේ සාර්ථක අසාර්ථක භාවයත් එමගින් ජනනය කෙරුනු මතභේදත් අනුසාරයෙන් ප්‍රන්ස විප්ලවයේ සියලුම 'නාඩි වැටීම්' පැහැදිලි කරමින් එංගල්ස් වික්ටර් ඇඩ්ලර්ට ලියූ අපූරු ලිපිය ඔහුට සිහි පත් වන්නට ඇත. තමන් ඩැන්ටන්ගේ චරිතය සිහිපත් කරවීමෙහි සමත් කොටසක් රඟ දක්වන අතරෙහි ලෙනින්ගේ කොටස රොබෙස්පියර්ගේ කොටසට සමාන වන බව ට්‍රොට්ස්කිට පෙනෙන්නට ඇත. ගිලටිනයේ සෙවනැල්ල මෙහොතකට තමන් හා ලෙනින් අතරට පැමිනියා සේ විය. යම් හෙයකින් ගැටුම වර්ධනය වී නම් ඩැන්ටන් සේ ම ට්‍රොට්ස්කි ද පරාජයට නියමිත ගැටුමක නිරත වූ බවක් එයින් පැවසෙන්නේ නැත. එසේ නැතිනම් ලෙනින් ද රොබෙස්පියර් සේ ම, පක්ෂාභ්‍යන්තරික මතභේදයක් ගිලටිනය මගින් විසඳා

ගැනුමට නැඹුරු වූ බවක් එයින් පැවසෙන්නේ නැත. මෙතැන්හි දී සාද ෘෂ්‍යය තව දුරටත් අදාල නො වේ. යුද්ධයට පක්ෂපාතී පක්ෂය එය ජයග්‍රහනය කලේ නම් තම ප්‍රතිවාදීන් මැඩීමට තල්ලු වනු ඇතැයි පෙනී ගියේ ය. එසේ නො කොට ඔවුන් හට තම කාර්යභාරය හා පොර බදන්නට පුලුවන්කමක් නැත. අර්බුදයට සාමකාමී විසඳුමක් ඇති කර ගත හැකි වූයේ සාමයට පක්ෂපාතී වූවන්ගේ පාලනය යටතේ පමනි. මන්ද, ඔවුන් හට විරුද්ධත්වය දරා සිටීමේ වැඩි හැකියාවක් තිබූ හෙයිනි. ට්‍රොට්ස්කිට අනුව මෙම සලකා බැලීම තීරනාත්මක විය. ඔහු ගිලටිනයේ සෙවනැල්ල පිට මං කරනු පිනිස මූලධර්ම හා පුද්ගල අභිවෘද්ධිකාමය පිලිබඳ අපූර්ව පරිත්‍යාගයක් කලේ ය." (ද ප්‍රොෆට් අන්ආම්ඩ්, ලන්ඩන් 1954, පි.390-91)

[26].ස්වේන්, පි.1.

[27]. ස්වේන්, පි. 1-2.

[28]. මහාචාර්ය ජේම්ස් වයිට් වසර ගනනාවක් ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයෙහි අධ්‍යාපන කටයුතුවල නිරත විය. ඔහු තැචර් කෙරෙහි ප්‍රබල ලෙස බල පෑවේ ය. ස්ටැලින් පුනස්ථාපනය කිරීමටත් ට්‍රොට්ස්කි අවමානයට පාත්‍ර කිරීමටත් වයිට් සැහෙන පරිශ්‍රමයක් වැය කලේ ය. ට්‍රොට්ස්කි අවමානයට පාත්‍ර කිරීමට පවතින අතිශය ඕනෑකම නිසා වයිට් ඇතැම්විට විකට නලුවකු මෙන් හැසුරුනේ ය. නිදර්ශන වශයෙන් ඔහුගේ කෙටිකාලීන ව පමනක් පැවති 'ජර්නල් ඔෆ් ට්‍රොට්ස්කි ස්ටඩීස්' නමැති ප්‍රකාශනයෙහි (තැචර් මෙහි සම කර්තෘත්වය ඉසිලී ය.) පල කෙරුනු කුප්‍රකට ලියවිල්ලකින් වයිට් මෙසේ පැවසී ය. 1917 ඔක්තෝබර් නැගිටීම පිලිබඳ තීරනාත්මක රාත්‍රියෙහි ට්‍රොට්ස්කි වැදගත් කිසිවක් නො කලේ ය.

"ඒ අනුව මිලිටරි විප්ලවීය කමිටුවෙහි සෙසු සාමාජිකයන් යම් යම් ආකාරවල විප්ලවීය කටයුතුවල නිරත වනු පිනිස පිටත් වගිය අතරෙහි ට්‍රොට්ස්කි - නැගීසිටීමට විරෝධය පෑ - කමනෙව් ද සමග "දුරකථනයට පිලිතුරු දීමට රඳවා තිබුනි." [වෙලුම 1,1993, පි.18]

සන්නද්ධ නැගිටීමෙහි ප්‍රධාන උපායිකයා හා නායකයාගේ වැඩ කටයුතු මහාචාර්ය වයිට් විසින් විස්තර කෙරුනේ එසේ ය.

වයිට් තවදුරටත් මෙසේ ත් අවධාරනය කලේ මැනවින් තහවුරු කෙරී තිබෙන ඓතිහාසික නරුනුවලට ප්‍රතිපක්ෂ ව ය. 1917 මාර්තුවෙහි, තාවකාලික ආන්ඩුව කෙරෙහි ස්ටැලින්ගේ දේශපාලනික පිලිවෙත අප්‍රේල් මාසයෙහි පෙරලා රුසියාවට පැමිනි ලෙනින් සටන් වැදුනු පිලිවෙත හා අඩු හෝ වැඩි වශයෙන් සමපාත විය. 1917 ලෙනින-ට්‍රොට්ස්කි පිලිබඳ කරුන ගැන කිව යුත්තේ දිගු කාලීන ව දන සිටිනු ලැබෙන පරිදි සත්තකින් ම ට්‍රොට්ස්කි 1929හි තම ජීවන චරිතයෙන් මේ බව ප්‍රකාශකලේ ය සන්නද්ධ නැගිටීම ක්‍රියාත්මක කිරීම පිලිබඳ ව බොල්ෂෙවික් පක්ෂයේ ප්‍රධාන නායකයන් අතරෙහි මතභේද පැවතියේ ය. මෙම මතභේද උපායාත්මක කරුනු පිලිබඳ ව ය; "දෘෂ්ටිය" සම්බන්ධ ව නො වී ය.

[29].http://www.nlpvf.nl/docs/VanRee WorldRevolution screen.pdf , p. 25

[30]. ඩේගේ තර්කනය පිලිබඳ ව සුදුසු පරිදි සාකච්ඡා කිරීමට නම් විස්තරාත්මක පරීක්ෂනයක් අවශ්‍ය වෙයි. ඔහුගේ ප්‍රවාදය පිලිබඳ ව අප්‍රවේසම් සහගත එක වැකියක සාරාංශ ගත කිරීමක් කල නොහැකි ය. ස්ටැලින්ගේ ක්‍රියාමාර්ගය තුල

"තනි රටේ සමාජවාදය" යන පාඨය ප්‍රකාශයට පත් වූ ආකාරයත් ට්‍රොට්ස්කි විසින් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල සමාජවාදී ගොඩනැගීම ඇරඹීමට එම ගොඩනැගීම විසින් ලෝක වෙලඳපොල සමග සම්බන්ධතා පැවැත්වීමෙහි අවශ්‍යතාවත් නිරවද්‍ය ජාත්‍යන්තර විප්ලවීය පිලිවෙතක අවශ්‍යතාවත් පිලිගැනුනු තාක් දුරට ඇති හැකියාව පිලිගනු ලැබීමත් අතරෙහි කිසියම් සමානත්වයක් පැවති බවත් ඩේ කිසිවිටක ඇඟවීමක් නො කලේ ය. ආර්ථික ජාතිකවාදය වෙනුවෙන් තර්ක කිරීමට ස්ටැලින් විසින් දරුනු උත්සාහයන් ඩේ විසින් විස්තර කෙරෙනුයේ "පක්ෂය රවටනු ලැබීමට කැමැත්තෙන් සිටි" දිරිය බල සිඳී ගිය දේශපාලනික වාතාවරනයක පිලිගැනීමට පාත්‍ර වූ "අභූත කතා" හැටියට ය. ස්ටැලින්ගේ "දක්ෂ උග්‍ර්‍රත හරඹය නිසා ඔහුට තම තර්කයට එක්තරා පරිමානයක සම්පරීක්ෂනාත්මක ස්වරූපයක් අත්පත් කර දීමට පවතින හැකියාව නිසා නො වේ නම් එය ජුගුප්සජනක ප්‍රෝඩාවක් හැටියට ඉවත දමනු ලැබෙනු ඇතැ"යි ඩේ සඳහන් කරයි. [*ලියොන් ට්‍රොට්ස්කි ඇන්ඩ් ද පොලිටික්ස් ඔෆ් ඉකොනොමික් අයිසලේෂන්* (කේම්බ්‍රිජ්,1973), පි.100-101.]

මෙම අවසන් වැකිය ස්වේන්ගේ ක්‍රියා පටිපාටිය පිලිබඳ ව සාධාරන විස්තරයක් ලෙස සැලකිය හැකි ය.

[3]. මෙය හුදෙක් මගේ ආත්මීය අදහස පමනක් ම නො වේ. මෙම කරුන පිලිබඳ ව ස්වේන්ගේ ව්‍යාජ ඉදිරිපත් කිරීම කියවූ පසු ව මම කැනඩාවේ මහාචාර්ය ඩේ අමතා කරුන ඔහුගේ අවධානයට යොමු කලෙමි. 2007 මාර්තු 13 වෙනි දා ලියන ලද ඊ-මේල් ලිපියකින් මම, ස්වේන්ගේ ජීවන චරිතයෙන් අදාල ඡේදය උපුටා දක්වා, මහාචාර්ය ඩේ ගෙන් ඔබ ඒ ගැන දැනුවත් දැයි විචාලෙමි. ස්වේන්ගේ කෘතියෙන් උපුටා දක්වන ලද ඡේදය, 'ලියොන් ට්‍රොට්ස්කි ඇන්ඩ් ද පොලිටික්ස් ඔෆ් ඉකොනොමික් අයිසලේෂන්' නමැති කෘතියෙන් ඔබ ඉදිරිපත් කල තර්කය පිලිබඳ බෙහෙවින් රලුපරලු සාවද්‍ය ඉදිරිපත් කිරීමක් හැටියට මට පෙනී යයි යනුවෙන් මම වැඩි දුරටත් පැවසුවෙමි. මට වැටහෙන පරිදි, ආර්ථික පිලිවෙත පිලිබඳ පක්ෂාභ්‍යන්තරික අරගලයෙහි තීරනාත්මක ප්‍රශ්නය හැටියට ඔබ සැලකුවේ හුදකලා රටක සමාජවාදය ගොඩනැගිය හැකි වේ ද යන්න යි. මෙම තීරනාත්මක ප්‍රශ්නය පිලිබඳ ව ට්‍රොට්ස්කි දරූ ආස්ථානය ඔබ අඛන්ඩ ව තර්ක කොට පෙන්වා දී තිබෙන පරිදි ස්ටැලින් පමනක් නොව ප්‍රියෝබ්‍රෂන්ස්කි දරූ ආස්ථානයට ද මූලික වශයෙන් පටහැනි විය.

මහාචාර්ය ඩේ ගෙන් මම එදින ම පිලිතුරක් ලදිමි. එහි මෙසේ සඳහන් විය.

"මා දරන ආස්ථානය සම්බන්ධයෙන් ඔබ සපුරා ම නිවැරදි ය." ඉක්බිති ව ඔහු මෙසේ ද පැවසී ය. සත්තකින් ම ට්‍රොට්ස්කි පිලිබඳ ව නිමක් නොමැති ව කුනු කසල ලියැවී තිබේ. එම කසල ගොන්නට මහාචාර්ය ස්වේන් තවත් එකතු කිරීමක් කර ඇති බව අසන්නට ලැබී මම කනස්සල්ලට පත් වෙමි. ට්‍රොට්ස්කි ආරම්භයෙහි සිට අවසානය දක්වා ම ජාත්‍යන්තරවාදියකු නො වී යැයි කෙනෙකු පවසනුයේ කෙසේ දැයි මට වටහා ගත නො හැකි ය. එය කෙනෙකු මවිතයට පත් වන පරිද්දෙන් ඓතිහාසික වාර්තාව සාවද්‍ය ලෙස කියවීමකි.

[32]. ස්වේන්, පි.2.

[33]. ස්වේන්, පි.3.

[34]. ස්වේන්, පි.3. ස්වේන් තම සටහන්වලින් නී-පාස් බැහැර කිරීම ඔහුගේ ම වැඩ කටයුතුවල අත්‍යන්තයෙන් ම වංචනික වූ අරමුනු පිලිබිඹු කරයි. නී-පාස්ගේ කෘතිවලින් ස්වේන්ට ගත හැකි ප්‍රයෝජනයක් නොමැත. නී-පාස්ගේ විශේෂත්වය වනුයේ, ට්‍රොට්ස්කි වැදගත් දේශපාලනික චින්තකයකු ද, විසි වන සියවසෙහි යුරෝපීය සංස්කෘතියෙහි ප්‍රමුඛ පුද්ගලයකු ද වන්නේ ය යනුවෙන් ඔහු විසින් සුවිශද ලෙස පිලිගනු ලැබීම යි. නී-පාස් හට ට්‍රොට්ස්කි "විප්ලවීය පුද්ගලයන් හිඟ නො වූ යුගයක, සාරාර්ථ වශයෙන් ම විප්ලවවාදියෙක් පමනක් නො වී ය. න්‍යාය හා අදහස් පිලිබඳ ක්ෂේත්‍රයෙහි" ට්‍රොට්ස්කිගේ "ජයග්‍රහනවල මහිමා ව බොහෝ අතින් ඊට අඩු නො වේ: ඔහු විසි වන සියවස තුල පසුගාමී රටවල් තුල

සමාජික වෙනස් වීම් උද්ගත වීම විශ්ලේෂනය කල පලමුවැන්නන් ගෙන්කෙනෙක් වෙයි. ට්‍රොට්ස්කි, එබඳු වෙනස් වීම් කෙරෙන් අනිවාර්යයෙන් වර්ධනය වන දේශපාලනික ප්‍රතිඵල පැහැදිලි කිරීමට යත්න දරූ ප්‍රථමයන් අතරෙහි ද කෙනෙක් වෙයි. ට්‍රොට්ස්කි ඔහුගේ මුලු ජීවිතය පුරා දවැන්ත පරිමානයෙන් රචනා කලේ ය; ට්‍රොට්ස්කි තුල ජීවත් වූ සුප්‍රකට ක්‍රියාකාරී මිනිසා පමනට ම ඔහු තුල ජීවත්වූ දේශපාලනික චිනතකයා ද ඔහුගේ පෞරුෂයෙහි ඓන්ද්‍රිය කොටසක් විය." 'ද සෝෂල් ඇන්ඩ් පොලිටිකල් තෝට් ඔෆ් ලියොන් ට්‍රොට්ස්කි' (ලන්ඩන්, 1978) පි. viii - ix.

[35]. ස්වේන්, පි.3.

[36]. ට්‍රොට්ස්කි, අපෝහක භෞතිකවාදී දර්ශනය විෂය කර ගෙන බොහෝ දීප්තිමත් රචනා ලිව්වේ ය. එහෙත් ස්වේන් මෙම කෘති සම්බන්ධයෙන් මුනි වත රකී. තව ද ඔහු, ට්‍රොට්ස්කි තම රචනාවන්හි ලා උපයෝග කර ගත් දාර්ශනික විධික්‍රමය පිලිබඳ අල්ප වූ ද උනන්දුවක් නොදක්වයි.

[37]. 'සිලෙක්ටඩ් රයිටිංග්ස්', වොලියුම් 2: 1927-34 (කේම්බ්‍රිජ්, එම්ඒ, 1999), පි.477.

[38]. සිවිල් යුද්ධයෙහි දී රතු හමුදාවේ ජයග්‍රහනය සම්බන්ධයෙන් ස්වේන්, ට්‍රොට්ස්කිට සම්මාන පුද කිරීමට මෙහෙයවෙයි. එහෙත් ඔහු, විප්ලවීය හමුදාවල ජයග්‍රහනයට තීරනාත්මක ව වැදගත් වූ ට්‍රොට්ස්කිගේ මිලිටරි නායකත්වයෙහි අංගෝපාංග හඳුනා ගැනුමට හෝ විශ්ලේෂනය කිරීමට අපොහොසත් විය. මිලිටරි න්‍යායාචාර්යවරයකු හා විප්ලවීය සේනාධිනායකයකු හැටියට ට්‍රොට්ස්කිගේ වර්ධනය පිලිබඳ ව බැරෑරුම් අධ්‍යයනයක් කරනු රිසි පාඨකයකු කර්නල් හැරල්ඩ් වෝල්ටර් නෙල්සන්ගේ 'ලියොන් ට්‍රොට්ස්කි ඇන්ඩ් ද ආර්ට් ඔෆ් ඉන්සරෙක්ෂන්' (ලන්ඩන්, 1988) නමැති කෘතිය පරිහරනය කිරීම සුදුසු ය. මිලිටරි විශේෂඥයකු හැටියට ලියමින් කර්නල් නෙල්සන් (ඔහු එක්සත් ජනපදයේ ආමි වෝ කොලීජියෙහි ඉගැන්වූවෙකි.) මිලිටරි ඉතිහාසයෙහි සැලකිය යුතු පුද්ගලයෙකු හැටියට ට්‍රොට්ස්කිගේ පරිනත වීම පිලිබඳ ව අතිශයින් ම වෛශයික වූ හා වෘත්තීමය විස්තරයක් ඉදිරිපත් කරයි. නෙල්සන්ගේ අවධානය සංකේන්ද්‍රනය වනුයේ 1915 හා 1917 අතර කාල පරිච්ඡේදය කෙරෙහි ය. ඔහුගේ විස්තරයෙන් ට්‍රොට්ස්කි "නිර්ව්‍යාජ විප්ලවීය ජනරාල්වරයකු - තීරනාත්මක විප්ලවීය ක්‍රියාකාරිත්වයන්ට නායකත්වය දිය හැකි හා ඒවා සංවිධානය කල හැකි පුද්ගලයකු හැටියට" ඉස්මතු වෙයි. ඔහු, විප්ලවය විසින් විසඳාලිය යුතු සන්නද්ධ ගැටුමෙහි ගැටලු පිලිබඳ අවබෝධයක් වර්ධනය කර ගනී; මෙම ගැටලු විසඳාලීම සඳහා විප්ලවයට කැඳවා ගත හැකි වන මූලාශ්‍ර ගැන ඇගයීමක් ඔහු තමන් සන්තක කර ගනී; මෙම මූලාශ්‍ර උපරිම ප්‍රතිඵල ලබා ගත හැකි වන පරිදි සංවිධාන කරනු පිනිස ඔහු සැලසුම් වර්ධනය කරයි; තව ද ඔහු විප්ලවීය ජයග්‍රහනය අත් පත් කරගනු පිනිස සටන් කල යුතු වන මිනිසුන් ප්‍රේරනය කරවන සාධක හඳුනා ගනී."(පි.4)

[39]. ස්වේන්, පි. 195.

[40]. ස්වේන්, පි. 160.

[41] ලන්ඩන්, 1976, පි.60.

[42]. *ද චැලෙන්ජ් ඔෆ් ද ලෙෆ්ට් ඔපසිෂන් 1926-1927* (නිව් යෝක්, 1980), පි. 106.

[43]. එම, පි.130-164.

[44]. ස්වේන්, පි.152.

[45]. ද ඉන්ටරෙග්නම් (ලන්ඩන්, 1954) පි. 318.

[46]. එම, පි. 313.

[47]. ද කොන්ෂන්ස් ඔෆ් ද රෙවලියුෂන්: කොමියුනිස්ට් ඔපසිෂන් ඉන් සෝවියට් රෂියා (නිව් යෝක්: සයිමන් සහ ෂුස්ටර්, 1960), පි. 223.

[48]. ස්වේන්, පි.194.

[49]. නිව් යෝක්, 1982, පි. 433.

© www.wsws.org